# පිරිත් සෙත් ශාන්තිය

## බෝදාගම චන්දිම නාහිමි

දුක්ඛප්පත්තා ච නිද්දුක්ඛා
භයප්පත්තා ච නිබ්භයා
සෝකප්පත්තා ච නිස්සෝකා
හොන්තු සබ්බේ පි පාණිනෝ

දුකින් පෙළෙන සත් දුකින් මිදෙත්වා
බියෙන් වෙසෙන සත් බිය නැති වෙත්වා
සොවින් තැවෙන සැම සොම්නස් වෙත්වා
නිතින් මෙ හැම සත් සුවපත් වෙත්වා

Printed and donated for free distribution by
**The Corporate Body of the Buddha Educational Foundation**
11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.
Tel: 886-2-23951198 , Fax: 886-2-23913415
Email: overseas@budaedu.org
Website:http://www.budaedu.org
**This book is strictly for free distribution, it is not to be sold.**
**නොමිලයේ බෙදාදීම පිණිසයි.**



# පෙරවදන

බෞද්ධයන්ට ආශිර්වාද අත් පොතක් වශයෙන් නිතර පරිහරණයට සුදුසු වන රත්නත්‍රයෙහි අපරිමිත ශක්තිය පෙන්නුම් කරන පිරිත් සූත්‍ර කිහිපයක් උපුටා ඔබ අතට ඉදිරිපත් කිරීමට ලැබීම ගැන සතුටු වෙමි.

මානසික අසහනය දුරු කරගැනීම සඳහා මෙන් ම, කායික පීඩාවන් දුරුකරගැනීම සඳහා ද ඉමහත් විශ්වාසයෙන් පරිහරණය කරමින් ප්‍රතිඵල ලැබිය හැකි සුවිශේෂ පිරිත් සූත්‍ර කිහිපයක් ම මේ අත්පොතට ඇතුළත් වේ. මේ පිරිත් දේශනාවන් නිතර නිතර සජ්ඣායනා කිරීමෙන් ඔබට උතුම් සෙත් ශාන්තියක් ලබාගත හැකි ය. සතර පොහෝ දිනවල උදේ දහවල් රාත්‍රී වශයෙන් ද, අනෙකුත් දිනවල තමාට පහසු ලෙස උදේ හෝ සවස එක් අවස්ථාවක් තෝරාගෙන මේ පිරිත් සූත්‍ර සජ්ඣායනා කිරීමෙන් ඔබටත්, ඔබ ගේ පවුලේ සැමටත්, අසල්වැසියන්ටත් සෙත් ශාන්තියක් ම උදාවේ. එපමණක් ද නොව මේ පිරිත් දේශනාව ශ්‍රවණය කරන ඔබ ගේ ඉෂ්ටකාමී දෙවියන් ගේ ආශිර්වාදය ද ඔබට ලැබෙනු ඇත.

මේ පොත සැකසීමේ දී බොහෝ දෙනාට නිවැරදිව කියවීමේ පහසුව සඳහා බැඳි අකුරුවලින් තොර ව හා බොහෝ සූත්‍රවල සිංහල අර්ථය ද සහිත ව පිළියෙල කරන ලදි. නිවැරදි ව වචන උච්චාරණය කරමින් එහි අර්ථය ගැන ද සිතා තුනුරුවන් පිළිබඳ සැබෑ ශ්‍රද්ධාවෙන් යුතු ව පිරිත් සජ්ඣායනා කළ යුතු ය.

ඔබ යන එන ගමන් බිමන්වල දී මේ ආරක්ෂක පිරිත් පොත් වහන්සේ රැගෙන යන්නේ නම් මැනවි. එසේ නොහැකි නම් මේ පුස්තකය ගෞරවණීය ස්ථානයක තබා එහි ආශිර්වාදය ලැබ, ගමන් පිටත්වීම වඩා සුබදායී වනු ඇත. පිරිත යනු බෞද්ධයන්ට සියලු ආකාරයේ ආශිර්වාදය සපයන ආධ්‍යාත්මික ශක්තිය ගෙන දෙන මහ බලැති සත්‍යක්‍රියා ධර්මයකි.

ඔබ ගේ නිවසේ කුඩා දරුවන්ටත් මේ පිරිත් දේශනාවන් හුරුකරවීමට උනන්දු වන්න.

-ආචාර්ය බෝදගම චන්දිම නාහිමි-
තායිවානයේ ප්‍රධාන සංඝනායක

ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනම
බණ්ඩාරගම
2003.08.30



# ප්‍රණාමය

බෞද්ධයන්ට පහසුවෙන් පරිහරණයට සුදුසු පිරිත් අත් පොතක් සකස් කිරීමට බුද්ධශාසන, අධිකරණ නීති ප්‍රතිසංස්කරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු වි.ජ.මු. ලොකුබණ්ඩාර මැතිතුමා විසින් කරන ලද ඉල්ලීමට අනුව තායිවානයේ ප්‍රධාන සංඝ නායක අතිපූජ්‍ය ආචාර්ය බෝදගම චන්දිම නාහිමිපාණන් මේ හස්තසාර ආශිර්වාද සත්‍යක්‍රියා සංග්‍රහය තායිවානයේ තායිපේ - සමාධි පදනම මඟින් පිටපත් ලක්ෂ දෙකක් මුද්‍රණය කොට ශ්‍රී ලංකාවට පරිත්‍යාග කිරීමට කටයුතු කිරීමට කටයුතු කරන ලදි.

මේ මහඟු කාර්‍යයේ දී සෝදුපත් බැලීමෙන් සහාය වූ කථිකාචාර්ය සෙනරත් විජේසුන්දර මැතිතුමාටත්, පරිගණක කටයුතු කරදුන්වජිරා ශාම්‍යමලි හරිශ්චන්ද්‍ර මෙනවියටත්,



‘ද ෆොන්ට් මාස්ටර්’ ආයතනය නාරාහේන්පිට. පෙළගැස්සීමේ දී සහාය වූ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය නින්දනේ චන්දවිමල හිමියන්ටත්, සියලු කටයුතුවල දී පහසුකම් දක්වූ ධර්මචක්‍ර ළමා නිවාසයේ අධ්‍යක්ෂ ශාස්ත්‍රවේදී කුඹුක්වැවේ පඤ්ඤාකිත්ති හිමියන් ඇතුළු කාර්ය මණ්ඩලයටත්, ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනමේ කළමනාකාර අධ්‍යක්ෂ ජගත් සුමතිපාල මහතා ප්‍රධාන සියලු සාමාජිකයන්ටත් කෘතඥතා පූර්වක පුණ්‍යානුමෝදනාව පිරිනමමි.

ආචාර්ය පල්ලේවෙල සාරද හිමි
ලේකම්,
ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනම,
වීදගම - බණ්ඩාරගම.
2003.08.30

# පටුන


| පටුන | පිටු | අංක |
|---|---|---|
| * නමස්කාරය | 01 - | 02 |
| * තෙරුවන් සරණ යෑම | 03 - | 04 |
| * පන්සිල් | 05 - | 06 |
| * අටසිල් | 07 - | 08 |
| * බුද්ධ වන්දනා | 09 - | 12 |
| * ධම්ම වන්දනා | 13 - | 16 |
| * සංඝ වන්දනා | 17 - | 20 |
| * මංගල සූත්‍රය | 21 - | 28 |
| * රතන සූත්‍රය | 29 - | 40 |
| * කරණීය මෙත්ත සූත්‍රය | 41 - | 46 |
| * ධජග්ග සූත්‍රය | 47 - | 60 |
| * සෙත් පිරිත් | 61 | |
| * අටවිසි පිරිත | 62 - | 63 |
| * ඇණවුම් පිරිත | 64 - | 66 |
| * අංගුලිමාල පිරිත | 67 | |
| * ජය පිරිත | 68 - | 71 |
| * වට්ටක පිරිත | 72 - | 73 |
| * ජයමංගල ගාථා | 74 - | 77 |
| * මහා ජයමංගල ගාථා | 78 - | 81 |

| | |
|---|---|
| * ජින පඤ්ජරය | 82 - 89 |
| * මහාකස්සපත්ථේර බොජ්ඣංගය | 90 - 93 |
| * මහාමොග්ගල්ලානත්ථේර බොජ්ඣංගය | 94 - 98 |
| * මහාචුන්දත්ථේර බොජ්ඣංගය | 99 - 101 |
| * බෝධ්‍යාංගයන්හි ඇති රෝග සුව කිරීමේ බලය | 102 |
| * බොජ්ඣංග පිරිත කිය යුතු ආකාරය | 103 - 105 |
| * **බෝධි පූජා සහිත දෛනික තෙරුවන් වන්දනාව** | 106 - 144 |




01



# නමස්කාරය

නමෝ තස්ස භගවතෝ අරහතෝ
සම්මා සම්බුද්ධස්ස.

නමෝ තස්ස භගවතෝ අරහතෝ
සම්මා සම්බුද්ධස්ස

නමෝ තස්ස භගවතෝ අරහතෝ
සම්මා සම්බුද්ධස්ස



# නමස්කාරය

ඒ භගවත් අර්හත් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

ඒ භගවත් අර්හත් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

ඒ භගවත් අර්හත් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!



# සරණ ගමනය

බුද්ධං සරණං ගච්ඡාමි.
ධම්මං සරණං ගච්ඡාමි.
සඞ්ඝං සරණං ගච්ඡාමි.

දුතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි.
දුතියම්පි ධම්මං සරණං ගච්ඡාමි.
දුතියම්පි සඞ්ඝං සරණං ගච්ඡාමි.

තතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි.
තතියම්පි ධම්මං සරණං ගච්ඡාමි.
තතියම්පි සඞ්ඝං සරණං ගච්ඡාමි.







# තෙරුවන් සරණ යෑම

මම බුදුන් සරණ යමි.
මම දහම් සරණ යමි.
මම සඟුන් සරණ යමි.

දෙවනුවත් මම බුදුන් සරණ යමි.
දෙවනුවත් මම දහම් සරණ යමි.
දෙවනුවත් මම සඟුන් සරණ යමි.

තෙවනුවත් මම බුදුන් සරණ යමි.
තෙවනුවත් මම දහම් සරණ යමි.
තෙවනුවත් මම සඟුන් සරණ යමි.



05



# පංච සීල

පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

අදින්නාදනා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

කාමේසු මිච්ඡාචාරා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

මුසාවාද වේරමණී සික්ඛාපදං සමාදියාමි.

සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි.







# පන්සිල්

ප්‍රාණ ඝාතයෙන් වැළකීමේ සිල්පදය සමාදන් වෙමි.

නුදුන් දෙය ගැනීමෙන් වැළකීමේ සිල්පදය සමදන් වෙමි.

කම්සුව වැරදි ලෙස විඳීමෙන් වැළකීමේ සිල්පදය සමාදන් වෙමි.

බොරු කීමෙන් වැළකීමේ සිල්පදය සමාදන් වෙමි.

මදයට හා ප්‍රමාදයට හේතුවන රහමෙර පානයෙන් වැළකීමේ සිල්පදය සමාදන් වෙමි.



07



# අට්ඨාංග සීල

01. පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
02. අදින්නාදනා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
03. අබ්‍රහ්මචරියා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
04. මුසාවාද වේරමණී සික්ඛාපදං සමාදියාමි.
05. සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
06. විකාල භෝජනා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
07. නච්ච ගීත වාදිත විසූක දස්සන මාලාගන්ධ විලේපනධාරණ මණ්ඩන විභූසනට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
08. උච්චාසයන මහාසයනා වේරමණී සික්ඛාපදං සමාදියාමි.





08

# අටසිල්

මෙහි 1 - 2 - 3 - 4 - 5 යන ශික්ෂා පදවල තේරුම පංචශීලයෙහි දී ප්‍රකාශ වූ සැටිමැයි.

තෙවැනි - සවැනි - සත්වැනි - අටවැනි ශික්ෂා පදවල තේරුම් මෙසේ ය.

03. කාම සංසර්ගයෙන් වැළකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි.

04. ඉර හැරුණු පසු ආහාර අනුභව කිරීමෙන් වැළැකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි.

07. නැටුම් - ගැයුම් - වැයුම් - විසුලු දැකීම් - මල් ගඳ විලවුන් දැරීම් - සැරසීම් - අලංකාරවීම් - යන දේවල්වලින් වැළැකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි.

08. වඩුරියනට වඩා උස් පාවලින් යුතු ආසනවලින් හා මහආසනවලින් වැළැකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි.

# බුද්ධ වන්දනා

ඉතිපි සෝ භගවා අරහං සම්මා සම්බුද්ධෝ විජ්ජාචරණ සම්පන්නෝ සුගතෝ ලෝක විදූ අනුත්තරෝ පුරිසදම්ම සාරථී සත්ථා දේවමනුස්සානං බුද්ධෝ භගවාති.

බුද්ධං ජීවිතං යාව නිබ්බානං සරණං ගච්ඡාමි.

යේ ච බුද්ධා අතීතා ච යේ ච බුද්ධා අනාගතා පච්චුප්පන්නා ච යේ බුද්ධා - අහං වන්දමි සබ්බදා.





# බුද්ධ රත්නය වන්දනා කිරීම

ඒ භාග්‍යවතුන් වහන්සේ සියලු පූජාවන් ලැබීමට සුදුසු ය යන අරුතින් අර්හත් නම් වන සේක. සියල්ල තමන් ගේ ඤාණයෙන් ම මනා කොට දැන ගත් සේක. ප්‍රඥාවෙන් හා සීල ආදි චරණ ධර්මවලින් සම්පූර්ණ වන සේක. යහපත් ගමනින් හා වදනින් යුතු වන සේක. අන් අයට හික්මවන්නට නොහැකි වූවන් හික්මවීමෙහි හැමට ම වඩා සමත් වූ සේක. දෙව් මිනිසුන් සහිත සියල්ලන්ට ම ගුරු වූ සේක. සත්‍යය අවබෝධ කළ සේක. සියලු පව් නැසූ සේක.

මම තිවන් දකින තෙක් බුද්ධරත්නය සරණ යමි.

අතීතයේ බුදු ව වැඩ සිටි, මෙ කල බුදුබව ලැබූ, මතු බුදුබව ලබන සියලු බුදුවරුන් මම හැම කල්හි වඳිමි.



නත්ථි මේ සරණං අඤ්ඤං -
බුද්ධෝ මේ සරණං වරං
ඒතේන සච්ච වජ්ජේන
- හෝතු මේ ජය මඞ්ගලං

උත්තමඞ්ගේන වන්දේහං-
පාදපංසුවරුත්තමං
බුද්ධේ යෝ ඛලිතෝ දෝසෝ
- බුද්ධෝ ඛමතු තං මමං

නමාමි බුද්ධං ගුණ සාගරන්තං
සත්තා සදා හොන්තු සුඛී අවේරා
කායෝ ජිගුච්ඡෝ සකලෝ දුගන්ධෝ
ගච්ඡන්ති සබ්බේ මරණං අහංච



මට බුදුරදුන් හැර වෙන පිහිටක් නොමැත. බුදුරජාණන් වහන්සේ මගේ උතුම් පිහිටයි. මේ සත්‍ය වචනයේ බලයෙන් මට ජයමංගලයක් වේවා!

බුදුරජාණන් වහන්සේ ගේ උතුම් පා තැබූ තැන වූ පස ද, සිරිපා දූවිල්ල ද මම හිස නමා වඳිමි. බුදුරජාණන් වහන්සේට මගෙන් සිදු වූ යම් වරදක් වේ නම් උන්වහන්සේ එයට සමාව දෙන සේක්වා!

ගුණ සයුරක් වූ බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා! සියලු සත්වයෝ නිදුක් නිරෝගී සුවපත් වූවාහු වෙත්වා! සියලු සිරුරු පිළිකුල් ය. දුගඳ ය. මම ද සියල්ලෝ ද මරණයට යති.

# ධම්ම වන්දනා

ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ
සන්දිට්ඨිකෝ අකාලිකෝ
ඒහි පස්සිකෝ ඔපනයිකෝ පච්චත්තං
වේදිතබ්බෝ විඤ්ඤූහීති.

ධම්මං ජීවිතං යාව නිබ්බානං සරණං ගච්ඡාමි.

# ධර්ම රත්නය වන්දනාකිරීම

බුදුරජාණන් වහන්සේ විසින් ධර්මය මනාකොට දේශනා කරන ලද්දේ ය. එය තමා ගේ නුවණින් ම දැක්ක යුතු ය. කල් නොයවා විපාක දෙන්නේ ය. එන්න ඇවිත් බලන්නැයි අන්‍යයන් කැඳවා දැක්වීමට තරම් උතුම් ගුණ ඇත්තේ ය. තමා ගේ සිතින් එළඹීමට සිතට අරමුණු කිරීමට සුදුසු ය. නුවණැත්තන් විසින් තම තමන් කෙරෙහි ලා දත යුත්තේ ය.

මම නිවන් ලබන තෙක් ම ධර්ම රත්නසමි.



යේ ච ධම්මා අතීතාච
- යේ ච ධම්මා අනාගතා
පච්චුප්පන්නා ච යේ ධම්මා
- අහං වන්දාමි සබ්බදා

නත්ථි මේ සරණං අඤ්ඤං
- ධම්මෝ මේ සරණං වරං
එතේන සච්ච වජ්ජේන
- හෝතු තේ ජය මඞ්ගලං

උත්තමඞ්ගේන වන්දේහං
- ධම්මං ච තිවිධං වරං
ධම්මේ යෝ ඛලිතෝ දෝසෝ
- ධම්මෝ ඛමතු තං මමං

නමාමි ධම්මං මුනිරාජ දේසිතං
සත්තා සදා හොන්තු සුඛී අවේරා
කායෝ ජිගුච්ඡෝ සකලෝ දුගන්ධෝ
ගච්ඡන්ති සබ්බේ මරණං අහංච



අතීත අනාගත වර්තමාන යන තුන් කාලයට ම අයත් බුදුවරුන් දූන වදාළ ධර්ම රත්නය හැම කල්හි මම වඳිමි.

මට අන් පිහිටක් නැත. ධර්ම රත්නය මගේ උතුම් පිහිටයි. මේ සත්‍ය වචන බලයෙන් මට යහපතක්ම වේවා!

පර්යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවේධ යන උතුම් ධර්ම රත්නයට මම හිස නමා වඳිමි. මේ ධර්ම රත්නයට මගෙන් සිදු වූ යම් වරදක් ඇත්නම් එයට ධර්ම රත්නයට මට ක්ෂමා කෙරේවා!

බුදුරදුන් දෙසූ ධර්ම රත්නයට මම වඳිමි. සත්වයෝ හැම කල්හි නිදුක් නීරෝගි සුවපත් වූවෝ වෙත්වා!

සියලු සිරුර පිළිකුල් සහගත ය. දුගඳ ය. මම ද සියල්ලෝ ද මරණයට යති.



# සංඝ වන්දනා

සුපටිපන්නෝ භගවතෝ සාවක සඞ්ඝෝ
උජුපටිපන්නෝ භගවතෝ සාවක සඞ්ඝෝ
ඤායපටිපන්නෝ භගවතෝ සාවක සඞ්ඝෝ
සාමීචි පටිපන්නෝ භගවතෝ සාවක සඞ්ඝෝ

යදිදං චත්තාරි පුරිස යුගානි
අට්ඨ පුරිස පුග්ගලා
ඒස භගවතෝ සාවක සඞ්ඝෝ
ආහුණෙය්‍යෝ පාහුණෙය්‍යෝ
දක්ඛිණෙය්‍යෝ අඤ්ජලිකරණීයෝ අනුත්තරං
පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්සාති.



# සංඝ රත්නය වන්දනා කිරීම

භාග්‍යවතුන් වහන්සේ ගේ ශ්‍රාවක සංඝ තෙමේ මැනවින් ගුණ ධර්ම පිළිපැදීම නැමැති ආර්ය මාර්ගයට පිළිපන්නේ ය. ඇද නැති ධර්ම මාර්ගයෙහි ගමන් කරන්නේ ය. නිවන් මඟට පිවිසියේ ය. නිවන් ලැබීමට සුදුසු ප්‍රතිපත්තියට පිවිසියේ ය.

ඒ සංඝයා වහන්සේ පුරුෂ යුග වශයෙන් අට දෙනෙකි. භාග්‍යවතුන් වහන්සේ ගේ මේ ශ්‍රාවක සංඝ තෙමේ දුර සිට ගෙනවුත් පුදන සිවුපසය ලැබීමට සුදුසු ය. පරලොව සඳහා දිය යුතු දන් ලබන්නට සුදුසු ය. ලෝවැසියනට උතුම් පින් එල හටගන්වන පින් කෙතකි.





සංඝං ජීවිතං යාව නිබ්බානං සරණං ගච්ඡාමි

යේ ච සංඝා අතීතා ච
යේ ච සංඝා අනාගතා
පච්චුපන්නා ච යේ සංඝා
අහං වන්දමි සබ්බදා

නත්ථි මේ සරණං අඤ්ඤං
සංඝෝ මේ සරණං වරං
ඒතේන සච්චවජ්ජේන
හෝතු මේ ජයමඞ්ගලං

උත්තමංගේන වන්දේහං
සංඝ ච තිවිධෝත්තමං
සංඝේ යෝ ඛලිතෝ දෝසෝ
සංඝෝ ඛමතු තං මමං

නමාමි සංඝං මුනිරාජ සාවකං
සත්තා සදා හොන්තු සුඛී අවේරා
කායෝ ජිගුච්ඡෝ සකලෝ දුගන්ධෝ
ගච්ඡන්ති සබ්බේ මරණං අහං ච





නිවන් ලබන තෙක් සංඝ රත්නය සරණ යමි.
අතීත වර්තමාන අනාගත යන තුන් කාලයට
අයිති සංඝයා රත්නය හැම කල්හි ම
මම වඳිමි.

මට අන් පිහිටක් නැත. සංඝ රත්නය මට උතුම් පිහිටයි. මේ සත්‍ය වචන බලයෙන් මට ජය මංගලයක් වේවා!

පෘථග්ජන සංඝ රත්නය ද ආර්ය මාර්ගයේ ගමන් කරන සංඝ රත්නය ද රහත් සංඝ රත්නය ද යන තෙවැදෑරුම් සංඝ රත්නයට මම හිස නමා වඳිමි. සංඝයා වහන්සේට මගෙන් යම් වරදක් වී ඇත්නම් සංඝ රත්නය ඒ වරදට මට ක්ෂමා කරන සේක්වා!

බුද්ධ ශ්‍රාවක සංඝයාට මම වඳිමි. සත්ත්වයෝ හැම කල්හි සුවපත් වෙත්වා. සියලු කය පිළිකුල් සහගත ය. දුගඳ ය. මම ද සියල්ලෝ ද මරණයට යති.

# මංගල සුත්තං

ඒවං මේ සුතං. ඒකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනේ අනාථපිණ්ඩිකස්ස ආරාමේ. අථඛෝ අඤ්ඤතරා දේවතා අභික්කන්තාය රත්තියා අභික්කන්ත වණ්ණා කේවල කප්පං ජේතවනං ඕභාසෙත්වා යේන භගවා තේනුපසංකමි. උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා ඒකමන්තං අට්ඨාසි. ඒකමන්තං ඨිතා ඛෝ සා දේවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි.

# මංගල සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදි. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවත් නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේ පිඬු සිටුහු ගේ ආරාමයේ වැඩ වසන සේක.

එකල්හි වනාහි නාම ගෝත්‍රයෙන් අප්‍රසිද්ධ වූ එක්තරා දිව්‍ය පුත්‍රයෙක් ප්‍රථම යාමය ඉක්ම වූ කල්හි යහපත් ශරීර වර්ණය ඇති ව සියලු ජේතවනය බුබුළුවා ගෙන යම් තැනෙක්හි බුදුරජාණන් වහන්සේ වසන සේක් ද එතැනට එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක සිටියේ ය. එකත් පස් ව සිටියා වූ ඒ දිව්‍යපුත්‍ර තෙමේ භාග්‍යවතුන් වහන්සේට ගාථාවකින් මෙසේ සැලකර සිටියේ ය.



01. බහු දේවා මනුස්සා ච
මංගලානි අචින්තයුං
ආකංඛමානා සොත්ථානං
බෲහි මංගල මුත්තමං

02. අසේවනා ච බාලානං
පණ්ඩිතානඤ්ච සේවනා
පූජා ච පූජනීයානං
ඒතං මංගල මුත්තමං

03. පතිරූපදේසවාසෝ ච
පුබ්බේ ච කතපුඤ්ඤතා
අත්තසම්මාපණිධි ච
ඒතං මංගල මුත්තමං

04. බාහු සච්චඤ්ච සිප්පඤ්ච
විනයෝ ච සුසික්ඛිතෝ
සුභාසිතා ච යා වාචා
ඒතං මංගල මුත්තමං



01. දෙලොවට යහපත කැමැති දෙවියෝ ද, මනුෂ්‍යයෝ ද, මංගල සම්මත කරුණු මොනවාදැයි සිතූහ. ඒ දෙව්මිනිසුන්ට අනුකම්පාවෙන් හිත සුව එලවන මංගලයන් දේශනා කළ මැනවි.

02. අනුවණ බාලයන් සේවනය නො කිරීම ද, පණ්ඩිතයන් සේවනය කිරීම ද, බුද්ධාදි පිදිය යුත්තන් පිදීම ද දෙලොව දියුණුව ගෙන දෙන කරුණු ය.

03. සුදුසු පෙදෙසක විසීම ද, පෙර කළ පින් ඇති බව ද, සිත මනාව පිහිටු වීම ද, උතුම් මංගල කරුණු ය.

04. බොහෝ ඇසූ පිරුතැන් ඇති බව ද, ශිල්ප දැනීම ද, මනා හික්මීම ද, සුබස් බිණුම ද මංගල කරණු ය.



05. මාතාපිතු උපට්ඨානං
පුත්තදරස්ස සංගහෝ
අනාකුලා ච කම්මන්තා
ඒතං මංගල මුත්තමං

06. දනඤ් ච ධම්මචරියා ච
ඤාතකානඤ් ච සංගහෝ
අනවජ්ජානි කම්මානි
ඒතං මංගල මුත්තමං

07. ආරතිවිරති පාපා
මජ්ජපානා ච සඤ්ඤමෝ
අප්පමාදෙ ච ධම්මේසු
ඒතං මංගල මුත්තමං

08. ගාරවෝ ච නිවාතෝ ච
සන්තුට්ඨී ච කතඤ්ඤුතා
කාලේන ධම්ම සවණං
ඒතං මංගල මුත්තමං



05. මවුපියනට උවටැන් කිරීම ද, අඹුදරුවනට සංග්‍රහ කිරීම ද, නිරවුල් කර්මාන්ත ද යන මේ කාරණා උතුම් මඟුල් ය.

06. දන් දීම ද, දස කුසල්හි හැසිරීම ද, නෑයනට සංග්‍රහ කිරීම ද, නිවැරදි කර්මාන්ත ද යන මේ කාරණා උතුම් මඟුල් ය.

07. පාපයෙහි නොඇල්මද, අකුසලයෙන් වෙන්වීම ද, මත් පැනින් වැළකීම ද, හැම කුසල් දහම්හි පමා නො වීම ද උතුම් මඟුල් ය.

08. ගරුකළ යුත්තන්ට ගරුකිරීම ද, යටහත් පහත් බව ද, ලද දෙයින් සතුටුවීම ද, කළගුණ සැලකිම ද උතුම් මඟුල් ය.



09. ඛන්තී ච සෝවචස්සතා
සමණානඤ් ච දස්සනං
කාලේන ධම්ම සාකච්ඡා
ඒතං මංගල මුත්තමං

10. තපෝ ච බ්‍රහ්මචරියං ච
අරියසච්චානදස්සනං
නිබ්බානසච්ඡිකිරියා ච
ඒතං මංගල මුත්තමං

11. ඵුට්ඨස්ස ලෝකධම්මේහි
චිත්තං යස්ස න කම්පති
අසෝකං විරජං ඛේමං
ඒතං මංගල මුත්තමං

12. ඒතාදිසානි කත්වාන
සබ්බත්ථමපරාජිතා
සබ්බත්ථ සොත්ථිං ගච්ඡන්ති තං
තේසං මංගල මුත්තමන්ති.



09. ඉවසිම ද, කීකරු බව ද, ශ්‍රමණයන් දැකීම ද, සුදුසු කල ධර්ම සාකච්ඡාව ද උතුම් මඟුල් ය.

10. තපස ද, උතුම් හැසිරීම ද, සිවුසස් දැකීම ද, නිවන් අවබෝධ කරගැනීම ද උතුම් මඟුල් ය.

11. අටලෝ දහමින් සිත කම්පා නොවේ ද, ශෝක රහිත ද, රාගාදි කෙලෙස් දූලි නැත් ද, බිය රහිත ද මේ උතුම් මඟුල් ය.

12. මේ බඳු මංගලයන් කොට සියලු තන්හි නොපැරදුනාහු සියලු තැන සැපතට යෙති. ඔවුන්ට මේ කරුණු තිස්අට උතුම් මඟුල් වේ. දෙලොව වැඩ සදලන කරුණු වේ.



# රතන සූත්තං

01. යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්තලික්ඛේ
සබ්බේව භූතා සුමනා භවන්තු
අථෝපි සක්කච්ච සුණන්තු භාසිතං

02. තස්මාහි භූතා නිසාමේථ සබ්බේ
මෙත්තං කරෝථ මානුසියා පජාය
දිවා ච රත්තෝ ච හරන්ති යේ බලිං
තස්මා හි නේ රක්ඛථ අප්පමත්තා

03. යං කිඤ්චි විත්තං ඉධ වා හුරං වා
සග්ගේසු වා යං රතනං පණීතං
නනෝසමං අත්ථි තථාගතේන
ඉදම්පි බුද්ධේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

# රතන සූත්‍රය

01. භූමියෙහි උපන්නා වූ හෝ අහසෙහි උපන්නා වූ හෝ යම් අමනුෂ්‍ය කෙනෙක් මෙහි රැස් වූවාහු වෙත් ද, ඒ සියලු භූතයෝ සතුටු සිත් ඇත්තාහු වෙත් වා! තව ද මාගේ වචනය මනා කොට අසත්වා!

02. අමනුෂ්‍යයිනි "යම් කරුණක් සඳහා මෙහි රැස්වූවාහු ද" එහෙයින් සියල්ලෝ ම මාගේ ධර්මය අසවු. මනුෂ්‍ය ප්‍රජාව කෙරෙහි මෛත්‍රිය කරවු. යම් මනුෂ්‍ය කෙනෙක් රෑ දවල්හි තොපට පූජා ගෙනෙත් ද එහෙයින් ඔවුන් රකිවු.

03. මේ මනුෂ්‍ය ලෝකයෙහි හෝ වෙනත් අවශේෂ ලෝකයක හෝ යම් ධනයක් වේ ද? ඒ කිසි තැනෙක තථාගතයන් හා සමාන වූ ධනයක් හෝ රත්නයක් හෝ නැත්මය. බුදුරදුන් කෙරෙහි මෙය ශ්‍රේෂ්ඨ වූ රත්නයකි. ඒ සත්‍ය බලයෙන් සත්ත්වයනට සෙත් වේවා!

04. ඛයං විරාගං අමතං පණීතං
යදජ්ඣගා සක්‍යමුනී සමාහිතෝ
න තේන ධම්මේන සමත්ථි කිඤ්චි
ඉදම්පි ධම්මේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

05. යං බුද්ධසෙට්ඨෝ පරිවණ්ණයී සුචිං
සමාධිමානන්තරිකඤ්ඤමාහු
සමාධිනාතේන සමෝ න විජ්ජති
ඉදම්පි ධම්මේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

06. යේ පුග්ගලා අට්ඨ සතං පසත්ථා
චත්තාරි ඒතානි යුගානි හොන්ති
තේ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා
ඒතේසු දින්නානි මහප්ඵලානි
ඉදම්පි සංඝෙ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

04. ආයුෂ්මාගී සමාධියෙහි සුපිහිටි සිත් ඇති ශාක්‍යකුලයෙහි උපන් මුනි තෙමේ රාගාදීන් ක්‍ෂය වන්නා වූ රාගාදියෙන් වෙන් වූ ප්‍රණීත වූ යම් නිවනක් නුවණින් අවබෝධ කෙළේ ද ඒ නිර්වාණ ධර්මය හා සමාන වූ කිසි රත්නයක් නැත. මෙය ද ධර්‍ම යෙහි පවත්නා ශ්‍රේෂ්ඨ වූ රත්න භාවයකි. ඒ සත්‍ය බලයෙන් සත්ත්වයනට සෙත් වේවා!

05. බුද්ධ ශ්‍රේෂ්ඨ තෙමේ ඉතා පිරිසිදු යමක් ප්‍රශංසා කොට දේශනා කළ සේක් ද? එය ආනන්තරික සමාධියයි. ඒ සමාන වූ අන්කිසි සමාධියක් නැත. මෙය ද ධර්මයේ ශ්‍රේෂ්ඨ භාවයකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා!

06. බුද්ධාදි සත් පුරුෂයන් විසින් පසස්නා ලද යම් අෂ්ටාර්‍ය පුද්ගල කෙනෙක් වෙත් ද? නොයෙක් ලෙසින් පසස්නා ලද එක සිය අටක් වූ ආර්‍ය පුද්ගල කෙනෙක් වෙත් ද ඔවුහු යුග සතරකි. බුද්ධ ශ්‍රාවක වූ ඒ ආර්‍ය පුද්ගලයෝ දක්ෂිණාවට සුදුසු වෙති. ඔවුන් කෙරෙහි දුන් දනයෝ මහත් ඵල ඇත්තාහු වෙති. මෙය ද සංඝයා වහන්සේ කෙරෙහි ප්‍රණීත රත්න භාවයකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා

07. යෙ සුප්පයුත්තා මනසා දල්හේන
නික්කාමිනෝ ගෝතම සාසනම්හි
තේ පත්තිපත්තා අමතං විගය්හ
ලද්ධා මුධා නිබ්බුතිං භුඤ්ජමානා
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

08. යථින්දඛීලෝ පඨවිං සිතෝ සියා
චතුබ්භි වාතේභි අසම්පකම්පියෝ
තථූපමං සප්පුරිසං වදාමි
යෝ අරියසච්චානි අවෙච්ච පස්සති
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

09. යේ අරියසච්චානි විභාවයන්ති
ගම්භීර පඤ්ඤේන සුදේසිතානි
කිඤ්චාපි තේ හොන්ති භුසප්පමත්තා
න තේ භවං අට්ඨමං ආදියන්ති
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

07. යම් රහත් කෙනෙක් ගෞතම ශාසනයෙහි මනාකොට යෙදුනාහු ස්ථිර සිතින් සියලු කෙලෙසුන් ගෙන් නික්මුණාහු ද? ඔවුහු නිවනට අරමුණු වශයෙන් බැස ඵල සමවත් සුවය නොමිලයේ ලැබ අනුභව කරන්නාහු මෙය ද සංඝයා වහන්සේ කෙරෙහි ප්‍රණීත රත්න භාවයකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා!

08. ඉන්ද්‍රඛීලය නම් වූ කණුව යම් සේ පොළොව ඇතුළට පිවිස සිටියේ සිවු දෙසින් හමන සුළඟින් සොලවාලිය නොහැකි වන්නේ ද? යමෙක් ආර්‍ය්‍ය සත්‍යයෙන් නුවණින් බැස දකී නම් ඒ සත් පුරුෂයා එබඳු ඉන්ද්‍රඛීලය හා සමාන කොට කියමි. මෙය ද සංඝයා වහන්සේ කෙරෙහි ප්‍රණීත රත්න භාවයකි. මේ සත්‍යබලයෙන් සත්වයින්ට සෙත් වේවා!

09. යමෙක් ගැඹුරු නුවණැති සර්වඥයන් වහන්සේ විසින් මැනවින් දේශනා කරනලද ආර්‍ය්‍ය සත්‍ය ධර්මයන් තමන් කෙරෙහි ප්‍රකට කෙරෙත් ද ඔවුහු කිසිසේත් පමාවුවෝ නොවෙත් ද, ඔවුහු අටවන භවයක් නම් නොගනිති. මෙය ද සංඝයා කෙරෙහි ශ්‍රේෂ්ඨ රත්න භාවයකි. මේ සත්‍ය බලයෙන් ඔබට සෙත් වේවා!

10. සහාවස්ස දස්සනසම්පදය
තයස්සු ධම්මා ජහිතා භවන්ති
සක්කායදිට්ඨී විචිකිච්ඡිතඤ්ච
සීලබ්බතංවාපි යදත්ථි කිඤ්චි
චතූහපායේහි ච විප්පමුත්තෝ
ඡචාභිඨානානි අභබ්බෝ කාතුං
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

11. කිඤ්චාපි සෝ කම්මං කරෝති පාපකං
කායේන වාචා උද චේතසා වා
අභබ්බෝ සෝ තස්ස පටිච්ඡාදය
අභබ්බතා දිට්ඨපදස්ස වුත්තා
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

12. වනප්පගුම්බේ යථා ඵුස්සිතග්ගේ
ගිම්හානමාසේ පඨමස්මිං ගිම්හේ
තථූපමං ධම්මවරං අදේසයි
නිබ්බානගාමිං පරමං හිතාය
ඉදම්පි බුද්ධේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

10. දශීන සමාපත්තිය සමඟ ම සක්කාය දිට්ඨිය ද, විචිකිච්ඡාව ද, සීලබ්බත පරාමාසය ද යන සංයෝජන ධර්ම තුන ඔහු විසින් හරණ ලද්දහු වෙති. හේ සතර අපායෙන් මිදුනේ වෙයි. පඤ්චානන්තර්‍ය කර්ම කිරීමට හා අන්‍ය ශාස්තෘවරයකු ද ඇදහීමට සුදුසු නො වේ. මෙය සංඝයා කෙරෙහි ශ්‍රේෂ්ඨ රත්න භාවයකි. මේ සත්‍ය බලයෙන් සත්‍වයින්ට සෙත් වේවා!

11. ඒ සෝවාන් පුද්ගල තෙමේ තිදෙරින් යම් පවක් කෙරේ ද? හෙතෙම එය සඟවාලීමට නොහැක්කේ වෙයි. නිවන් දුටුවහු ගේ නිවන පවු සැඟවීමෙහි නොහැකි බව බුදුන් වහන්සේ විසින් දෙසන ලදි. මෙය ද සංඝයා වහන්සේ කෙරෙහි ප්‍රණීතවූ රත්න භාවයකි. මේ සත්‍ය බලයෙන් සත්වයින්ට සෙත් වේවා!

12. ග්‍රීෂ්ම ඍතුවේ පළමුවන බක්මසෙහි රුක් ලැහැබ යම් සේ පිපුණ අග ඇත්තේ වේ ද, බුදුරජ තෙමේ එබඳු උපමා ඇති නිවනට පමුණුවන උත්තම ධර්මයක් සත්හට සෙත් පිණිස දෙසීය. මෙය ද සංඝයා වහන්සේ කෙරෙහි ප්‍රණීත වූ රත්න භාවයකි. මේ සත්‍යබලයෙන් සත්‍වයින්ට සෙත් වේවා

13. වරෝ වරඤ්ඤූ වරදෝ වරාහරෝ
අනුත්තරෝ ධම්මවරං අදේසයි
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

14. ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං
විරත්තචිත්තා ආයතිකේ භවස්මිං
තේ ඛීණබීජා අවිරුළ්හිච්ඡන්දා
නිබ්බන්ති ධීරා යථා යම්පදීපෝ
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

15. යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්තලික්ඛෙ
තථාගතං දේවමනුස්ස පූජිතං
බුද්ධං නමස්සාම සුවත්ථි හෝතු





13. උතුම් වූ නිවන දන්නා වූ නිවන දෙන්නා වූ ශ්‍රේෂ්ඨ වූ බුදුරජාණන් වහන්සේ උතුම් ධර්මයක් දෙසූ සේක. මෙය ද බුදුරජාණන් වහන්සේ කෙරෙහි ශ්‍රේෂ්ඨ වූ රත්න භාවයකි. මේ සත්‍ය බලයෙන් සත්වයිනට සෙත් වේවා!

14. යම් කෙනෙකුන් ගේ පුරාණකර්ම ගෙවී ගියේ ද අලුතින් ඇතිවන කර්මයකුත් නැත්ද, මතු භවයෙහි නො ඇළුණු සිත් ඇති ක්ෂය කළ ප්‍රතිසන්ධි විඥාන බීජ ඇති වැඩෙන ඡන්දයක් නැති ඒ ධෘතිමත් රහත්හු මේ නිවුණු පහන් මෙන් පිරිනිවෙති. මෙය ද සංඝයා කෙරෙහි වූ උතුම් රත්න භාවයකි. මේ සත්‍ය බලයෙන් සත්වයිනට සෙත් වේවා!

15. පොළොවෙහි උපන් හෝ අහසෙහි උපන් හෝ අමනුෂ්‍ය කෙනෙක් මෙතන්හි රැස් ව සිටිත් ද ඒ අප දෙව් මිනිසුන් විසින් පුදන ලද බුදුරදුන් වඳිමු. මේ සත්‍යබලයෙන් සත්වයිනට සත් වේවා!

16. යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්තලික්ඛෙ
තථාගතං දේවමනුස්ස පූජිතං
ධම්මං නමස්සාම සුවත්ථි හෝතු

17. යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්තලික්ඛෙ
තථාගතං දේවමනුස්ස පූජිතං
සංඝං නමස්සාම සුවත්ථි හෝතු







16. පොළොවෙහි උපන් හෝ අහසෙහි උපන් හෝ යම් අමනුෂ්‍ය කෙනෙක් මෙතන්හි රැස් ව සිටිත් ද ඒ අප දෙව්මිනිසුන් විසින් පුදන ලද තථාගත දේශිත ධර්මය වඳිමු.

17. පොළොවෙහි උපන් හෝ අහසෙහි උපන් හෝ යම් අමනුෂ්‍ය කෙනෙක් මෙතන්හි රැස් ව සිටිත් ද ඒ අප දෙව් මිනිසුන් විසින් පුදන ලද ශ්‍රාවක සංඝයා වහන්සේ වඳිමු.

**15, 16, 17, ශක්‍ර දේවේන්ද්‍රයා විසින් කියන ලද ගාථා තුනකි. විශාලා මහනුවර තුන්බිය දුරු කිරීම පිණිස රතන සූත්‍රය දෙසන ලදි. උදේ සවස අපල දුරු කර ගැනීම සඳහා භාවිතා කළ යුතු උතුම් සෙත් පිරිතකි.**



# කරණීය මෙත්ත සුත්තං

1. කරණීයමත්ථ කුසලේන
යං තං සන්තං පදං අභිසමෙච්ච
සක්කෝ උජූ ච සූජූ ච
සුවචෝ චස්ස මුදූ අනතිමානි

2. සන්තුස්සකෝ ච සුභරෝ ච
අප්පකිච්චෝ ච සල්ලහුකවුත්ති
සන්තින්ද්‍රියෝ ච නිපකෝ ච
අප්පගබ්භෝ කුලේසු අනනුගිද්ධෝ

3. න ච බුද්දං සමාචරේ කිඤ්චි
යේන විඤ්ඤූ පරේ උපවදෙය්‍යුං
සුඛිනෝ වා ඛේමිනෝ හොන්තු
සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා





# කරණීය මෙත්ත සූත්‍රය

1. ශාන්ත පදයට පැමිණ වසනු කැමැත්තහු විසින් යමක් කළ යුතු ද? අභිවෘද්ධියෙහි දක්‍ෂයා එය කළයුතු ය. හේ සමර්ථයෙක් වන්නේ ය. අවංක වන්නේ ය. මැනවින් අවංක වන්නේ ය. කීකරු වන්නේ ය. මෘදු වන්නේ ය. නිහතමානි වන්නේ ය.

2. සන්තෝෂ ඇත්තෙක් වන්නේ ය. පහසුවෙන් පෝෂණය කළ හැක්කෙක් වන්නේ ය. ස්වල්ප කටයුතු ඇත්තෙක් වන්නේ ය. සැහැල්ලු පැවතුම් ඇත්තෙක් වන්නේ ය. සන්සුන් ඉඳුරන් ඇත්තෙක් වන්නේ ය. ප්‍රඥාවත් වන්නේ ය. හැඩිදැඩි නොවන්නේ ය. කුලයන්හි නො ඇලෙන්නේ ය.

3. යම් ක්‍රියාවක් නිසා නුවණැති අන්‍යයෝ නින්ද කෙරෙති නම් එබඳු කුඩා වූ වරදක් පවා නො කරන්නේ ය. සියලු සත්හු සුව ඇත්තෝ භය නැත්තෝ වෙත්වා! සියලු සත්හු සුවයෙන් යුතු සිත් ඇත්තෝ වෙත්වා!

4. යේ කේචි පාණභූතත්ථි
තසා වා ථාවරා වා අනවසේසා
දීඝා වා යේ මහන්තා වා
මජ්ඣිමාරස්ස කාණුකථූලා

5. දිට්ඨා වා යේව අද්දිට්ඨා
යේ ච දූරේ වසන්ති අවිදූරේ
භූතා වා සම්භවේසී වා
සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා

6. න පරෝ පරං නිකුබ්බේථ
නාතිමඤ්ඤේථ කත්ථචිනං කඤ්චි
බ්‍යාරෝසනා පටිඝසඤ්ඤා
නාඤ්ඤමඤ්ඤස්ස දුක්ඛමිච්ඡෙය්‍ය



Love all animals and they will love you.





4. කෙලෙස් ඇති සත්වයෝනද කෙලෙස් රහිත සත්වයෝ ද යන සියලු ප්‍රාණභූත සත්ව කෙනෙක් වෙත් ද දික් වූ හෝ මහත් වූ හෝ මධ්‍යම වූ හෝ කුඩා ශරීර ඇත්තා වූ හෝ ඉතා කුඩා වූ හෝ ස්ථූල වූ සත්වයෝ වෙත් ද?

5. තම ඇසට පෙනෙන්නා වූ නො පෙනෙන්නා වූ සත්වයෝ වෙත් ද යම් සත්ව කෙනෙක් දුර හෝ වසත් ද ළඟ හෝ වසත් ද උපන්නා වූ යම් සත්ව කෙනෙක් වෙත් ද ඉපැදෙමින් සිටින යම් සත්ව කෙනෙක් වෙත් ද?

6. අනෙකෙක් අනෙකකු නො රවටන්නේ ය. කිසි තැනෙක්හි ඒ කිසිවකුට අවමන් නො කරන්නේ ය. කය වචන දෙකින් කරන රෝෂණයෙන් ද සිතින් කරන ක්‍රෝධයෙන් ද ඔවුනොවුන්ට දුක් නො කැමැති වන්නේ ය.

7. මාතා යථා නියං පුත්තං
ආයුසා ඒකපුත්තමනුරක්ඛේ
එවම්පි සබ්බභූතේසු
මානසං භාවයේ අපරිමාණං

8. මෙත්තං ච සබ්බලෝකස්මිං
මානසං භාවයේ අපරිමාණං
උද්ධං අධෝ ච තිරියඤ්ච
අසම්බාධං අවේරං අසපත්තං

9. තිට්ඨං චරං නිසින්නෝ වා
සයානෝ වා යාවතස්ස විගතමිද්ධෝ
එතං සතිං අධිට්ඨෙය්‍ය
බ්‍රහ්මමේතං විහාරං ඉධමාහු

10. දිට්ඨිඤ්ච අනුපගම්ම සීලවා
දස්සනේන සම්පන්නෝ
කාමේසු විනෙය්‍ය ගේධං
නහිජාතු ගබ්භසෙය්‍යං පුනරේතීති



7. යම් සේ මවු තොමෝ ආයුෂයෙන් ස්වකීය පුත්‍රයා රකී ද එසේ ම සියලු සතුන් කෙරෙහි අප්‍රමාණ මෛත්‍රී සිත වඩන්නේ ය.

8. පමණ රහිත වූ එසේ ම පීඩා රහිත වූ වෛර චේතනා රහිත වූ සතුරන් රහිත වූ සිතෙහි වූ මෛත්‍රීය ද උඩ යට සිරස යන සියලු සත්ව ලෝකයෙහි වඩන්නේ ය.

9. සිටිමින් හෝ යමින් හෝ හිඳිමින් හෝ සයනය කරමින් හෝ යම්තාක් කල් නො නිඳා ද ඒතාක් කල් මෛත්‍රී ස්මෘතිය වඩන්නේ ය.

10. මිථ්‍යා දෘෂ්ටියට නො පැමිණ ශ්‍රෝතාපන්න මාර්ග ඥාන දර්ශනයෙන් යුක්ත වූයේ වස්තුකාමයෙහි ගිජු බව හෙවත් ක්ලේශ කාමය සකෘදගාමී අනාගාමී මාර්ග දෙකින් ප්‍රහීණ කොට ඒකාන්තයෙන් මවු කුස පිළිසිඳ ගැනීමට නැවත නො පැමිණෙන්නේ ය.



# ධජග්ග සූත්‍රය

ඒවං මේ සුතං. ඒකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනේ අනාථපිණ්ඩිකස්ස ආරාමේ. තත්‍ර ඛෝ භගවා භික්ඛූ ආමන්තේසි භික්ඛවෝති. භදන්තේති තේ භික්ඛූ භගවතෝ පච්චස්සෝසුං භගවා ඒතදවෝච.

භූතපුබ්බං භික්ඛවේ දේවාසුරසංගාමෝ සමූපබ්බූළ්හෝ අහෝසි. අථඛෝ භික්ඛවේ සක්කෝ දේවානමින්දෝ දේවේ තාවතිංසේ ආමන්තේසි. සචේ මාරිසා දේවානං සංගාමගතානං උප්පජ්ජෙය්‍ය භයං වා ජම්භිතත්තං වා ලෝමහංසෝ වා මමේව තස්මිං සමයේ ධජග්ගං උල්ලෝකෙය්‍යාථ. මමං හි වෝ ධජග්ගං උල්ලෝකයතං යං භවිස්සති භයං වා ජම්භිතත්තං වා ලෝමහංසෝ වා සෝ පහීයිස්සති.

# ධජග්ග සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදි. එක් සමයෙක්හි බුදු රජතෙම සැවැත් නුවර සමීපයෙහි වූ ජේත නම් කුමාරයා ගේ උයනෙහි අනේපිඬු සිටුහු කර වූ අරම්හි වැඩ වෙසෙයි. එකල්හි වනාහි භාග්‍යවත් වූ බුදු රජතෙම මහණෙනියි භික්ෂූන්ට ආමන්ත්‍රණය කෙළේ ය. ඒ භික්ෂූහු වහන්සැයි කියා භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළ සේක.

මහණෙනි පෙර වූවක් කියමි. ඒ කිමෙක් ද යත්? දෙවියන් හා සූරයන් ගේ යුද්ධයක් හටගත්තේ විය. ඉක්බිති සක් දෙව්රජ තෙමේ තව්තිසා වැසි දෙවියන් කැඳවීය. නිදුකානෙනි යුද්ධයට ගිය දෙවියන්ට බයක් හෝ තැතිගැන්මෙක් හෝ රෝමෝද්ගමයෙක් හෝ ඉදින් උපන්නේ වී නම් හෝ එකල්හි මගේ ම ධ්වජාග්‍රය බලන්නාවූ තොපට බියෙන් හෝ තැති ගැන්මෙක් හෝ රෝමෝද්ගමයක් හෝ වේ ද එය පහ වෙයි.

නෝ චේ මෙ ධජග්ගං උල්ලෝකෙය්‍යාථ අථපජාපතිස්ස දේවරාජස්ස ධජග්ගං උල්ලෝකෙය්‍යාථ පජාපතිස්ස හි වෝ දේවරාජස්ස ධජග්ගං උල්ලෝකයතං යං හවිස්සති හයං වා ජම්හිතත්තං වා ලෝමහංසෝ වා සෝ පහීයිස්සති.

නෝ චේ පජාපතිස්ස දේවරාජස්ස ධජග්ගං උල්ලෝකෙය්‍යාථ අථ වරුණස්ස දේවරාජස්ස ධජග්ගං උල්ලෝකෙය්‍යාථ වරුණස්ස හි වෝ දේවරාජස්ස ධජග්ගං උල්ලෝකයතං යං හවිස්සති හයං වා ජම්හිතත්තං වා ලෝමහංසො වා සෝ පහීයිස්සති.

නෝ චේ වරුණස්ස දේවරාජස්ස ධජග්ගං උල්ලෝකෙය්‍යාථ අථ ඊසානස්ස දේවරාජස්ස ධජග්ගං උල්ලෝකෙය්‍යාථ ඊසානස්ස හි වෝ දේවරාජස්ස ධජග්ගං උල්ලෝකයතං යං හවිස්සති හයං වා ජම්හිතත්තං වා ලෝමහංසො වා සෝ පහීයිස්සති.

මගේ ධ්වජාග්‍රය ඉදින් නොබලා මේ ඉක්බිත්තෙන් ප්‍රජාපති නම් දෙව් රජු ගේ කොඩි අග බලවු. ප්‍රජාපති නම් දෙව් රජු ගේ කොඩි අග බලන තොපට යම් බියක් හෝ තැතිගැන්මෙක් හෝ රෝමෝද්ගමනයෙක් හෝ වේ ද එය පහ වේ.

ප්‍රජාපති දෙව් රජුන් ගේ ධ්වජාග්‍රය ඉදින් නොබලවු නම් ඉක්බිති වරුණ දෙව් රජුන් ගේ ධ්වජාග්‍රය බලවු. වරුණ දෙව් රජු ගේ ධ්වජාග්‍රය බලන්නාවූ තොපට යම් බියෙක් හෝ තැතිගැන්මෙක් හෝ ලොමු දැහැගැන්මෙක් හෝ වේ ද එය පහ වේ.

වරුණ නම් දෙව් රජුහු ගේ කොඩි අග ඉදින් නොබලවු නම් නැවත ඊසාන නම් දෙව් රජුහු ගේ කොඩි අග බලවු ඊසාන නම් දේව රාජයා ගේ කොඩි කෙළවර බලන තොපට බියක් හෝ යම් තැතිගැන්මෙක් හෝ යම් රෝමෝද්ගමනයෙක් හෝ වේ ද එය පහ වේ.



තං බෝ පන භික්ඛවේ සක්කස්ස වා
දේවානමින්දස්ස ධජග්ගං උල්ලෝකයතං
පජාපතිස්ස වා දේවරාජස්ස ධජග්ගං උල්ලෝකයතං
වරුණස්ස වා දේවරාජස්ස ධජග්ගං උල්ලෝකයතං
ඊසානස්ස වා දේවරාජස්ස ධජග්ගං උල්ලෝකයතං
යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලෝමහංසො
වා සෝ පහීයේථාපි නෝපි පහීයේථ
තං කිස්සහේතු සක්කෝ භික්ඛවේ
දේවානමින්දෝ අවීතරාගෝ අවීතදෝසෝ අවීතමෝහෝ
භී රුච්ඡම්භි උත්‍රාසි පලායීති.



මහණෙනි, සක් දෙව් රජහු ගේ හෝ ධ්වජාග්‍රය බලන්නවුන්ට ප්‍රජාපතී නම් දෙව් රජහු ගේ හෝ ධ්වජාග්‍රය බලන්නවුන්ට වරුණ නම් දෙව් රජහු ගේ හෝ ධ්වජාග්‍රය බලන්නවුන්ට ඊසාන නම් දෙව් රජහු ගේ ඒ ධ්වජාග්‍රය බලන්නවුන්ට යම් බියක් හෝ තැතිගැන්මක් හෝ රෝමෝද්ගමයක් හෝ වේ ද එය පහ වේ හෝ නොපහ වේ. එයට කාරණ කිමයත්? මහණෙනි, සක් දෙව් රජ තෙමේ නොපහ වූ රාග ඇත්තේ ය. නොපහ වූ ද්වේෂ ඇත්තේ ය. නොපහ වූ මෝහ ඇත්තේ ය. බාන සුලු ය. තැතිගන්නා සුලු ය. වෙසෙසින් ම බාන සුලු ය. පලා යන සුලු ය.



අහඤ්ච ඛෝ භික්ඛවේඑවං වදමි. සචේ තුම්හාකං භික්ඛවේ අරඤ්ඤගතානං වා රුක්ඛමූලගතානං වා සුඤ්ඤාගාරගතානං වා උප්පජ්ජෙය්‍ය භයං වා ඡම්භිතත්තං වා ලෝමහංසෝ වා මමේව තස්මිං සමයෙ අනුස්සරෙය්‍යාථ

ඉතිපි සෝ භගවා අරහං සම්මා සම්බුද්ධෝ විජ්ජාචරණ සම්පන්නෝ සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ පුරිසදම්මසාරථී සත්ථා දේවමනුස්සානං බුද්ධෝ භගවාති.





මහණෙනි, මම මෙසේ කියමි. මහණෙනි වලට ගියා වු හෝ රැක් මුලට ගියා වූ හෝ ජන විචික්ත ස්ථානයට ගියා වූ හෝ තොපට බියෙක් හෝ තැතිගැන්මෙක් හෝ රෝමෝද්ගමනයෙක් හෝ ඉදින් උපදනේ වී නම් එකල්හි මා ම සිහි කරවු. ඒ භාග්‍යවත් තෙමෙ මේ කාරණයෙන් අර්හත් ය. සම්‍යක් සම්බුද්ධ ය. අෂ්ට විද්‍යා පසළොස් චරණ ධර්මයෙන් යුක්ත ය. සුගත ය. ලෝකවිදූ ය. අනුත්තර ය. පුරිස දම්ම සාරථී ය. ශාස්තෘ ය. බුද්ධ ය. භාග්‍යවත් ය.



මමංහි වෝ භික්ඛවේ අනුස්සරතං යං භවිස්සති භයංවා ජම්භිතත්තං වා ලෝමහංසෝ වා සෝ පහීයිස්සති. නෝ චේ මං අනුස්සරෙය්‍යාථ අථ ධම්මං අනුස්සරෙය්‍යාථ

ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ සන්දිට්ඨිකෝ අකාලිකෝ ඒහිපස්සිකෝ ඔපනයිකෝ පච්චත්තං වෙදිතබ්බෝ විඤ්ඤූහීති. ධම්මංහි වෝ භික්ඛවේ අනුස්සරතං යං භවිස්සති භයං වා ජම්භිතත්තං වා ලෝමහංසෝ වා සෝ පහීයිස්සති.



මහණෙනි, මා සිහි කරන තොපට බියෙක් හෝ තැතිගැන්මෙක් හෝ යම් රෝමොද්ගමයෙක් හෝ වේ ද එය දුරු වේ. ඉදින් මා සිහි නොකෙරේ නම් ධර්මය සිහි කරවු. බුදුන් විසින් ධර්මය මනාකොට දේශනා කරන ලදි. තමා විසින් ප්‍රත්‍යවේක්ෂා ඤාණයෙන් දත යුතු ය. කල්නොයවා විපාක දෙන සුලු ය. තමා සිත්හි ඉපදවීමට සුදුසු ය. නුවණැත්තන් විසින් තමා කෙරෙහි ලා දත යුතු ය. මහණෙනි ධර්මය සිහි කරන්නා වූ තොපට යම් බියක් හෝ තැතිගැන්මෙක් හෝ රෝමොද්ගමයක් හෝ වේ නම් එය පහ වේ.



නෝ චේ ධම්මං අනුස්සරෙය්‍යාථ අථ සංඝං අනුස්සරෙය්‍යාථ සුපටිපන්නෝ භගවතෝ සාවකසංඝෝ උජුපටිපන්නෝ භගවතෝ සාවකසංඝෝ ඤායපටිපන්නෝ භගවතෝ සාවකසංඝෝ සාමීචිපටිපන්නෝ භගවතෝ සාවකසංඝෝ යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිසපුග්ගලා ඒස භගවතෝ සාවකසංඝෝ ආහුනෙය්‍යෝ පාහුනෙය්‍යෝ දක්ඛිණෙය්‍යෝ අඤ්ජලිකරණීයෝ අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්සාති සංඝං හි වෝ භික්ඛවේ අනුස්සරතං යං භවිස්සති භයං වා ජම්භිතත්තං වා ලෝමහංසෝ වා සෝ පහීයිස්සති. තං කිස්සහේතු? තථාගතෝ භික්ඛවේ අරහං සම්මා සම්බුද්ධෝ වීතරාගෝ වීතදෝසෝ වීතමෝහෝ අභීරු අච්ජම්භී අනුත්‍රාසීඅපලායීති.



ධර්මය ඉදින් සිහි නොකෙරේ නම් ඉක්බිති සංඝයා සිහි කරවු. බුදුන් ගේ ශ්‍රාවක සංඝ තෙමේ මනාව පිළිපන්නේ ය. බුදුන් ගේ ශ්‍රාවක සංඝ තෙමේ නිවන සඳහා පිළිපන්නේ ය. බුදුන් ගේ ශ්‍රාවක සංඝ තෙමේ නිවනට අනුකූල වූ පිළිවෙතට පිළිපන්නේ ය. යම් අටපුරිස් පුඟුල් කෙනෙක් ඇද්ද බුදුන් ගේ මේ ශ්‍රාවක සංඝ තෙමේ දුරිනුදු ගෙන හැර දිය යුතු වූ ප්‍රත්‍යය ලැබීමට සුදුසු ය. සියලු ලෝවැස්සන් විසින් දෙහොත් මුදුනෙහි තබා කරන නමස්කාරයට සුදුසු ය. සියලු ලෝවැස්සා ගේ උතුම් වූ පින් කෙතකැයි මෙසේ වූ සංඝයා සිහි කරන තොපට යම් භයක් හෝ තැතිගැන්මෙක් හෝ ලොමු දෑහැ ගැනීමෙක් හෝ වේ ද එය ම ප්‍රහීණ වන්නේ ය. එයට කාරණ කවරේද මහණෙනි රහත් වූ සම්‍යක් සම්බුද්ධ වූ බුදුරජ තෙම නැසූ රාග ඇත්තේ ය. නැසූ ද්වේෂ ඇත්තේ ය. නැසූ මෝහය ඇත්තේ ය. බිය නැත්තේ ය. තැතිගැනුම් නැත්තේ ය. චිත්තෝත්‍රාසයක් නැත්තේ ය. බියෙන් පලා නොයන්නේ ය.

ඉදමවෝච භගවා. ඉදං වත්වා සුගතෝ අථාපරං
ඒතදවෝච සත්ථා

අරඤ්ඤේ රුක්ඛමූලේ වා
සුඤ්ඤාගාරේව භික්ඛවෝ
අනුස්සරේථ සම්බුද්ධං
භයං තුම්හාක නෝ සියා

නෝචේ බුද්ධං සරෙය්‍යාථ
ලෝක ජෙට්ඨං නරාසභං
අථ ධම්මං සරෙය්‍යාථ
නීයානිකං සුදේසිතං

නෝ චේ ධම්මං සරෙය්‍යාථ
නීයානිකං සුදේසිතං
අථ සංඝං සරෙය්‍යාථ
පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං

එවං බුද්ධං සරන්තානං
ධම්මං සංඝඤ් ච භික්ඛවෝ
භයං වා ජම්භිතත්තං වා
ලෝමහංසෝ න හෙස්සතීති

බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළ සේක. නැවත භාග්‍යවතුන් වහන්සේ මෙසේ ද පැවසූ සේක.

මහණෙනි, වනයෙහි වෘක්ෂමූලයෙහි දී හෝ රුක් මුලෙක දී හෝ ශූන්‍යාගාරයෙහි දී හෝ බුදුන් මෙනෙහි කරවු. තොපට බියක් නොවන්නේ ය. ලොවට දෙටු වූ බුදුන් සිහි නොකරන්නහු නම් නෛර්‍යාණික වූ මැනවින් දෙසන ලද ධර්මය සිහි නොකරන්නු නම් පුණ්‍යක්ෂේත්‍ර වූ සංඝයා සිහි කරවු. මෙසේ බුදුන් දහම් සඟුන් සිහි කරන්නා වූ තොපට බියක් තැතිගැනීමක් ලොමු දෑහැගැනීමක් නොවන්නේ ය.



# සෙත් පිරිත්



# අට විසි පිරිත

1. තණ්හංකරෝ මහාවීරෝ
මේධංකරෝ මහායසෝ
සරණංකරෝ ලොකහිතෝ
දීපංකරෝ ජුතින්ධරෝ

2. කොණ්ඩඤ්ඤො ජනපාමොක්ඛෝ
මංගලෝ පුරිසාසභෝ
සුමනෝ සුමනෝ ධීරෝ
රේවතෝ රතිවද්ධනෝ

3. සොභිතෝ ගුණ සම්පන්නෝ
අනෝ මදස්සී ජනුත්තමෝ
පදුමෝ ලෝකපජ්ජෝතෝ
නාරදෝ වරසාරථි

4. පදුමුත්තරෝ සත්ත සාරෝ
සුමේධෝ අග්ගපුග්ගලෝ
සුජාතෝ සබ්බලෝකග්ගෝ
පියදස්සී නරාසභෝ

5. අත්ථදස්සී කාරුණිකෝ
ධම්මදස්සී තමෝනුදෝ
සිද්ධත්ථෝ අසමෝ ලෝකේ
තිස්සෝ වරදසංවරෝ

6. ඵුස්සෝ වරදසම්බුද්ධෝ
විපස්සී ච අනූපමෝ
සිඛී සබ්බහිතෝ සත්ථා
වෙස්සභූ සුඛදයකෝ

7. කකුසන්ධෝ සත්ථවාහෝ
කෝණාගමනෝ රණඤ්ජහෝ
කස්සපෝ සිරිසම්පන්නෝ
ගෝතමෝ සක්‍යපුංගවෝ

8. තේසං සච්චේන සීලේන
ඛන්ති මෙත්ත බලේන ච
තේපි ත්වං අනුරක්ඛන්තු
ආරෝග්‍යේන සුඛේනචාති



# ඇණවුම් පිරිත

1. යේ සන්තා සන්ත චිත්තා - තිසරණ සරණා
එත්ථ ලෝකන්තරේවා භුම්මා භුම්මා ච
දේවා ගුණගණගහණබ්‍යාවටා සබ්බකාලං
ඒතේ ආයන්තු දේවා වරකණකමයේ -
මේරුරාජෙ වසන්තෝ සන්තෝ සන්තෝ
සහේතුං මුනිවරවචනං සෝතුමග්ගං
සමග්ගං

2. සබ්බේසු චක්කවාලේසු යක්ඛා දේවා ච
බ්‍රහ්මුණෝ යං අම්හේහි කතං පුඤ්ඤං
සබ්බ සම්පත්ති සාධකං සබ්බේ තං
අනුමෝදිත්වා සමග්ගා සාසනෙ රතා
පමාදරහිතා හොන්තු ආරක්ඛාසු
විසේසතෝ



3. සාසනස්ස ච ලෝකස්ස - වුද්ධී භවතු
සබ්බදා සාසනම්පි ච ලෝකඤ්ච - දේවා
රක්ඛන්තු සබ්බදා සද්ධිං හොන්තු සුඛි
සබ්බේ - පරිවාරේහි අත්තනෝ අනිඝා
සුමුනා හොන්තු - සහ සබ්බෙහි ඤාතිභී

රාජතෝ වා චොරතෝ වා මනුස්සතෝ වා අමනුස්සතෝ වා අග්ගිතෝ වා උදකතෝ වා පිසාචතෝ වා ඛාණුකතෝ වා කණ්ටකතෝ වා නක්ඛන්තතෝ වා ජනපදරෝගතෝ වා අසද්ධම්මතෝ වා අසන්දිට්ඨීතෝ වා අසප්පුරිසතෝ වා චණ්ඩ හත්ථි අස්ස මිග ගෝණ කුක්කුර අහිවිච්ඡික මණිසප්පදීපි අච්ඡ තරච්ඡ සූකර මහිස යක්ඛ රක්ඛසාදිහි නානා භයතෝ වා නානා රෝගතෝ වා නානා උපද්දවතෝ වා ආරක්ඛං ගණ්හන්තු





පණිධානතෝ පට්ඨාය තථාගතස්ස දස පාරමියෝ දස උපපාරමියෝ දස පරමත්ථපාරමියෝ පඤ්ච මහා පරිච්චාගේ තිස්සෝ චරියා පච්ඡිමභවේ ගබ්භාවක්කන්තිං ජාතිං අභිනික්ඛමනං පධානචරියං බෝධිපල්ලංකේ මාර විජයං සබ්බඤ්ඤුතඤ්ඤාණ පටිවේධං නවලෝකුත්තර ධම්මේති සබ්බේපි මේ බුද්ධ ගුණේ ආවජ්ජිත්වා වේසාලියා තීසු පාකාරන්තරේසු තියාමරත්තිං පරිත්තං කරෝන්තෝ ආයස්මා ආනන්දත්ථෙරෝ විය කාරුඤ්ඤ චිත්තං උපට්ඨපෙත්වා

කෝටිසත සහස්සේසු - චක්කවාලේසු දේවතා
යස්සාණං පතිගණ්හන්ති - යඤ්ච වෙසාලියං පුරේ
රෝගා මනුස්ස දුබ්භික්ඛා - සම්භූතං තිවිධං භයං
ඛිප්පමන්තරධාපේසි - පරිත්තං තං භණාමහෙ

# අංගුලිමාල පිරිත

පරිත්තං යං භණන්තස්ස
නිසින්නට්ඨාන ධෝවනං
උදකම්පි විනාසේති
සබ්බමේව පරිස්සයං
සොත්ථිනා ගබ්භවුට්ඨානං
යං ච සාධෙති තං ඛණේ
" ථෙරස්සංගුලිමාලස්ස
ලෝක නාථේන භාසිතං
කප්පට්ඨායී මහා තේජං පරිත්තං තං භණාමහෙ

යතෝහං භගිනි අරියාය ජාතියා ජාතෝ නාභි ජානාමි සඤ්චිච්චපාණං ජීවිතා වෝරෝපෙතා තේන සච්චේන සොත්ථි තෙ හෝතු සොත්ථි ගබ්භස්සාති

බුදුරජාණන් වහන්සේ විසින් අංගුලිමාල මහරහතුන් වහන්සේට මෙය උගන්වා වදාරණ ලදි. දරු පල ලැබීමට සූදනම් මව්වරුන්ට මේ පිරිත භාවිතා කිරීම ඉතා මැනවි

# ජය පිරිත

සිරි ධිති මති තේජෝ ජයසිද්ධි මහිද්ධි මහා ගුණං අපරිමිත පුඤ්ඤාධිකාරස්ස සබ්බන්තරාය නිවාරණ සමත්ථස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

ද්වත්තිංස මහා පුරිසලක්ඛණානුභාවේන
අසීත්‍යනුව්‍යඤ්ජන ලක්ඛණානුභාවේන
අට්ඨුත්තරසත මංගල ලක්ඛණානු භාවේන
ඡබ්බණ්ණරංස්‍යානුභාවෙන කේතුමාලානු
භාවේන දසපාරමිතානුභාවේන දස උප
පාරමිතානුභාවේන දස පරමත්ථ
පාරමිතානුභාවේන සීල සමාධි
පඤ්ඤානුභාවේන බුද්ධානුභාවේන
ධම්මානුභාවෙන සංඝානුභාවේන
තේජානුභාවේන ඉද්ධ්‍යානුභාවේන බලානු
භාවේන ඤෙය්‍යධම්මානුභාවේන
චතුරාසීතිසහස්ස ධම්මක්ඛන්ධානුභාවේන



නවලෝකුත්තර ධම්මානුභාවේන අට්ඨංගික
මග්ගානුභාවේන අට්ඨ සමාපත්ත්‍යානුභාවේන
ජලභිඤ්ඤානුභාවේන මෙත්තා - කරුණා -
මුදිතා - උපේක්ඛානුභාවේන සබ්බ
පාරමිතානුභාවේන
රතනත්තය සරණානුභාවේන තුය්හං[1] සබ්බ
රෝග
සෝක උපද්දව දුක්ඛදෝමනස්සුපායාසා
විනස්සන්තු
සබ්බ සංකප්පා තුය්හං[1] සමිජ්ඣන්තු
දීඝායුකෝ හෝතු
සත වස්ස ජීවේන සමංගිකෝ හෝතු සබ්බදා!

ආකාස පබ්බත වන භූමි තටාක ගංගා මහා
සමුද්ද
ආරක්ඛක දේවතා සදා තම්හෙ[2] අනුරක්ඛන්තු
සබ්බ
බුද්ධානුභාවේන සබ්බ ධම්මානුභාවේන සබ්බ
සංඝානුභාවේන බුද්ධරතනං ධම්මරතනං
සංඝරතනං

තින්නං රතනානං ආනුභාවේන චතුරාසීති
සහස්ස
ධම්මක්ඛන්ධානුභාවේන පිටකත්තයානුභාවේන
ජිනසාවකානුභාවේන සබ්බේ තෙ රෝගා සබ්බේ
තේ භයා සබ්බේ තේ අන්තරායා සබ්බේ තේ
උපද්දවා සබ්බේ තේ දුන්නිමිත්තා සබ්බේ තේ
අවමංගලා විනස්සන්තු

ආයුවඩ්ඪකෝ ධනවඩ්ඪකෝ සිරිවඩ්ඪකෝ
යසවඩ්ඪකෝ බලවඩ්ඪකෝ වණ්ණවඩ්ඪකෝ
සුඛවඩ්ඪකෝ හෝතු සබ්බදා

දුක්ඛ රෝග භයාවේරා සෝකා සබ්බේ උපද්දවා
අනේකා අන්තරායාපි විනස්සන්තු ච තේජසා
ජය සිද්ධි ධනං ලාභං - සොත්ථී භාග්‍යං සුඛං බලං
සිරි ආයූ ච වණ්ණෝ ච භෝගං වුද්ධි ච යසවා
සතවස්සා ච ආයූ ච - ජීව සිද්ධී භවන්තු තේ

**මේ පිරිත සියලු රෝගයන්ට ද සියලු ජයග්‍රහණයන්ට ද යක්‍ෂ භයට හා ග්‍රහ දෝෂවලට ද යහපති.**

---

තමන් ගැන කියන විට 1"මයිහං" යනුවෙන් ද 2 "අම්හේ" යනුවෙන් ද 3" මේ" යනුවෙන් ද යොද ගන්න.



# වට්ටක පිරිත

1. පුරෙන්තං බෝධි සම්භාරේ නිබ්බත්තං
වට්ටක ජාතියං යස්ස තේජේන දවග්ගි
මහා සත්තං විවජ්ජයි

2. ථේරස්ස සාරිපුත්තස්ස - ලෝකනාථේන
භාසිතං කප්පට්ඨායි මහතේජං - පරිත්තං තං
භණාමහේ

3. අත්ථි ලෝකේ සීලගුණෝ සච්චං
සෝචෙය්‍යානුද්දයා තේන සච්චේන කාහාමි
සච්ච කිරියමනුත්තරං

4. ආවජ්ජිත්වා ධම්ම බලං - සරිත්වා පුබ්බකෙ
ජිනෙ සච්චබල මවස්සාය - සච්චකිරිය
මකා සහං



5. සන්තිපක්ඛා අපතනා - සන්තිපාද අවඤ්චනා
මාතා පිතා ච නික්ඛන්තා - ජාතවේද පටික්කම

6. සහසච්චෙ කතේ මය්හං - මහා පජ්ජලිතෝ සිඛී
වජ්ජෙසි සෝළස කරීසානි - උදකං පත්වා
යථා සිඛී
සච්චේන මෙ සමෝ නත්ථි - එසා මෙ සච්ච
පාරමිතා

---

වස විස උපද්‍රවලට ද ගිනි බිය ආදියෙන් වැළකීමට හා දැවීමෙන් හටගත් තුවාල ආදියට වතුර තෙල් මැතිරීමට යහපති.



# ජයමංගල ගාථා

1. බාහුං සහස්ස මහිනිම්මිත සායුධං තං
ගිරිමේඛලං උදිතඝෝර සසේන මාරං
දනාදි ධම්ම විධිනා ජිතවා මුනින්දෝ
තං තේජසා හවතු තේ ජයමංගලානි

2. මාරාතිරේක මහියුජ්ඣිත සබ්බ රත්තිං
ඝෝරම්පනාලවක මක්ඛ මථද්ධ යක්ඛං
ඛන්ති සුදන්ත විධිනා ජිතවා මුනින්දෝ
තං තේජසා හවතු තේ ජයමංගලානි

3. නාලාගිරිං ගජවරං අතිමත්ත හූතං දවග්ගි
චක්ක මසනීව සුදරුණං තං මෙත්තම්බු
සේක විධිනා ජිතවා මුනින්දෝ තං තේජසා
හවතු තේ ජයමංගලානි



4. උක්ඛිත්ත ඛග්ග මතිහත්ථ සුදරුණං තං
ධාවං තියෝජනපථංගුලිමාල වන්තං
ඉද්ධීභිසංඛත මනෝ ජිතවා මුනින්දෝ
තං තේජසා භවතු තේ ජයමංගලානි

5. කත්වාන කට්ඨමුදරං ඉව ගබ්භිනියා
චිඤ්චාය දුට්ඨ වචනං ජනකාය මජ්ඣෙ
සන්තේන සෝම විධිනා ජිතවා මුනින්දෝ
තං තේජසා භවතු තේ ජයමංගලානි

6. සච්චං විහාය මතිසච්චක වාද කේතුං
වාදභිරෝපිතමනං අතිඅන්ධභූතං
පඤ්ඤාපදීප ජලිතෝ ජිතවා මුනින්දෝ
තං තේජසා භවතු තේ ජයමංගලානි



7. නන්දෝපනන්ද භුජගං විබුධං මහිද්ධිං
පුත්තේන ථේර භුජගේන දමාපයන්තෝ
ඉද්ධූප දේස විධිනා ජිතවා මුනින්දෝ
තං තේජසා භවතු තේ ජයමංගලානි

8. දුග්ගාහ දිට්ඨි භුජගේන සුදට්ඨ හත්ථං
බ්‍රහ්මං විසුද්ධි ජුති මිද්ධි බකාභිධානං
ඤාණාගදේන විධිනා ජිතවා මුනින්දෝ
තං තේජසා භවතු තේ ජයමංගලානි

9. ඒතාපි බුද්ධ ජයමංගල අට්ඨගාථා
යෝ වාචකෝ දින දිනේ සරතේ මතන්දී
හි ත් වානනේක විවිධානි චුපද්දවානි
මොක්ඛං සු ඛං අධිගමෙය්‍ය නරෝ සපඤ්ඤෝ





හවතු සබ්බ මංගලං රක්ඛන්තු සබ්බ දේවතා
සබ්බ බුද්ධානුභාවේන සදා සොත්ථී භවන්තු තේ

හවතු සබ්බ මංගලං රක්ඛන්තු සබ්බ දේවතා
සබ්බ ධම්මානුභාවේන සදා සොත්ථී භවන්තු තේ

හවතු සබ්බ මංගලං රක්ඛන්තු සබ්බ දේවතා
සබ්බ සංඝානුභාවේන සදා සොත්ථී භවන්තු තේ

නක්ඛත්ත යක්ඛ භූතානං පාපග්ගහ නිවාරණා
පරිත්තස්සානුභාවේන හන්තු තේසං උපද්දවේ



---

1. තමන් සඳහා කියන විට මේ කියා යොදාගත යුතු ය.
2. මෙතන්දී වෙනුවට එතන්දී කියා ඇත.

# මහා ජය මංගල ගාථා

මහා කාරුණිකෝ නාථෝ හිතාය සබ්බ පාණිනං
පූරෙත්වා පාරමී සබ්බා පත්තෝ සම්බෝධිමුත්තමං
ඒතේන සච්ච වජ්ජේන හෝතු තේ ජයමංගලං

ජයන්තෝ බෝධියා මූලේ සක්‍යානං නන්දි වද්ධනෝ
ඒවං තුය්හං ජයෝ හෝතු ජයස්සු ජයමංගලං

සක්කත්වා බුද්ධ රතනං ඕසධං උත්තමං වරං
හිතං දේව මනුස්සානං බුද්ධ තේජේන සොත්ථිනා
නස්සන්තුපද්දවා සබ්බේ දුක්ඛා වූපසමෙන්තු තේ

සක්කත්වා ධම්ම රතනං ඕසධං උත්තමං වරං
පරිළාහූපසමනං ධම්ම තේජේන සෝත්ථිනා
නස්සන්තුපද්දවා සබ්බේ භයා 'වූපසමෙන්තු තේ





සක්කත්වා සංඝ රතනං ඕසධං උත්තමං වරං
ආහුනෙය්‍යං පාහුනෙය්‍යං සංඝ තේජේන
සොත්ථිනා නස්සන්තුපද්දවා සබ්බෙ රෝගා
වූපසමෙන්තු තේ

යං කිඤ්චි රතනං ලෝකේ විජ්ජති විවිධා පුථූ
රතනං බුද්ධ සමං නත්ථි තස්මා සොත්ථි භවන්තු තේ

යං කිඤ්චි රතනං ලෝකේ විජ්ජති විවිධා පුථූ
රතනං ධම්ම සමං නත්ථි තස්මා සොත්ථි භවන්තු තේ

යං කිඤ්චි රතනං ලෝකේ විජ්ජති විවිධා පුථූ
රතනං සංඝ සමං නත්ථි තස්මා සොත්ථි භවන්තු තේ



නත්ථි මේ සරණං අඤ්ඤං බුද්ධෝ මේ සරණං වරං
ඒතේන සච්චවජ්ජේන හෝතු තේ ජයමංගලං

නත්ථි මේ සරණං අඤ්ඤං ධම්මෝ මේ සරණං වරං
ඒතේන සච්චවජ්ජේන හෝතු තේ ජයමංගලං

නත්ථි මේ සරණං අඤ්ඤං සංඝෝ මේ සරණං වරං
ඒතේන සච්චවජ්ජේන හෝතු තේ ජයමංගලං

සබ්බීතියෝ විවජ්ජන්තු සබ්බ රෝගෝ විනස්සතු
මා තේ භවත්වන්තරායෝ සුඛී දීඝායුකෝ භව

භවතු සබ්බ මංගලං රක්ඛන්තු සබ්බ දේවතා
සබ්බ බුද්ධානුභාවේන සදා සොත්ථි භවන්තු තේ

භවතු සබ්බ මංගලං රක්ඛන්තු සබ්බ දේවතා
සබ්බ ධම්මානුභාවේන සදා සොත්ථි භවන්තු තේ



හවතු සබ්බ මංගලං රක්ඛන්තු සබ්බ දේවතා
සබ්බ සංඝානුභාවේන සදා සොත්ථී භවන්තු තේ

නක්ඛත්ත යක්ඛ භූතානං පාපග්ගහ නිවාරණා
පරිත්තස්සානුභාවේන හන්තු තේසං උපද්දවේ

---

1. තමන් සඳහා කියන විට මේ කියා යොදා ගත යුතු ය.
2. තමන් සඳහා කියන විට "මය්හං" කියා යොදා ගත යුතු ය.





# ජින පඤ්ජරය

1. ජයාසනගතා වීරා
ජෙත්වා මාරං සවාහිණිං
චතුසච්චාමතරසං
යේ පිවිංසු නරාසභා

2. තණ්හංකරාදයෝ බුද්ධා
අට්ඨවීසති නායකා
සබ්බේ පතිට්ඨිතා තුය්හං
මත්ථකේ තේ මුනිස්සරා

3. සිරේ පතිට්ඨිතා බුද්ධා
ධම්මෝ ච තව ලෝචනේ
සංඝෝ පතිට්ඨිතෝ තුය්හං
උරේ සබ්බ ගුණාකරෝ



4. හදයේ අනුරුද්ධෝ ච
සාරිපුත්තෝ ච දක්ඛිණේ
කොණ්ඩඤ්ඤෝ පිට්ඨිභාගස්මිං
මොග්ගල්ලානෝසි වාමකේ

5. දක්ඛිණේ සවණේ තුය්හං
ආහුං ආනන්ද රාහුලා
කස්සපෝ ච මහානාමෝ
උභෝසුං වාම සෝතකේ

6. කේසන්තේ පිට්ඨිභාගස්මිං
සූරියෝ විය පභංකරෝ
නිසින්නෝ සිරිසම්පන්නෝ
සෝභිතෝ මුනිපුංගවෝ



7. කුමාර කස්සපෝ නාම
මහේසී චිත්‍රවාදකෝ
සෝ තුය්හං වදනේ නිච්චං
පතිට්ඨාසි ගුණාකරෝ

8. පුණ්ණෝ අංගුලිමාලෝ ච
උපාලී නන්ද සීවලී
ථේරා පඤ්ච ඉමේ ජාතා
ලලාටේ තිලකා තව

9. සේසාසීති මහාථේරා
විජිතා ජිනසාවකා
ජලන්තා සීල තේජේන
අංගමංගේසු සණ්ඨිතා





10. රතනං පුරතො ආසි
දක්ඛිණෙ මෙත්ත සුත්තකං
ධජග්ගං පච්ඡතො ආසි
වාමෙ අංගුලිමාලකං

11. ඛන්ධ මොර පරිත්තඤ්ච
ආටානාටිය සුත්තකං
ආකාසච්ඡදනං ආසී
සේසා පාකාර සඤ්ඤිතා

12. ජිනාණා බල සංයුත්තේ
ධම්මපාකාර ලංකතේ
වසතො තේ චතුකිච්චේන
සදාසම්බුද්ධ පඤ්ජරේ





13. වාතපිත්තාදි සඤ්ජාතා
බාහිරජ්ඣත්තුපද්දවා
අසේසා විලයං යන්තු
අනන්ත ගුණ තේජසා

14. ජිනපඤ්ජර මජ්ඣට්ඨං
විහරන්තං මහීතලේ
සදා පාලෙන්තු ත්වං සබ්බේ
තේ මහා පුරිසාසභා

15. ඉච්චෙව මච්චන්ත කතෝ සුරක්ඛෝ
ජිනානුභාවේන ජිතුපපද්දවෝ
බුද්ධානුභාවේන හතාරි සංඝෝ
චරාහි සද්ධම්මනුභාව පාලිතෝ



16. ඉච්චෙව මච්චන්ත කතෝ සුරක්ඛෝ
ජිනානුභාවේන ජිතුපපද්දවෝ
ධම්මානුභාවේන හතාරි සංඝෝ
චරාහි සද්ධම්මනුභාව පාලිතෝ

17. ඉච්චෙව මච්චන්ත කතෝ සුරක්ඛෝ
ජිනානුභාවේන ජිතුපපද්දවෝ
සංඝානුභාවේන හතාරි සංඝෝ
චරාහි සද්ධම්මනුභාව පාලිතෝ

18. සද්ධම්මපාකාර පරික්ඛිතෝසි
අට්ඨාරියා අට්ඨ දිසාසු හොන්ති
එත්ථන්තරේ අට්ඨනාථා භවන්ති
උද්ධං විතානංව ජිනා ඨිතා තේ



19. භින්දන්තෝ මාරසේනං තව සිරසි ඨිතෝ
බෝධි මාරුය්හ සත්ථා
මොග්ගල්ලානෝසි වාමේ වසති භුජතටේ
දක්ඛිණේ සාරිපුත්තෝ
ධම්මෝ මජ්ඣේ උරස්මිං විහරති
භවතෝ
මොක්ඛතෝ මෝර යෝනිං
සම්පත්තෝ බොධිසත්තෝ චරණ යුගගතෝ
භානු ලෝකේක නාථෝ

20. සබ්බාවමංගලමුපද්දවදුන්නිමිත්තං
සබ්බීති රෝග ගහදෝස මසේස නින්ද
සබ්බන්තරාය භය දුස්සුපිනං අකන්තං
බුද්ධානුභාවපවරේන පයාතු නාසං





21. සබ්බාවමංගලමුපද්දවදුන්නිමිත්තං
සබ්බීති රෝග ගහදෝස මසේස නින්ද
සබ්බන්තරාය භය දුස්සුපිනං අකන්තං
ධම්මානුභාවපවරේන පයාතු නාසං

22. සබ්බාවමංගලමුපද්දවදුන්නිමිත්තං
සබ්බීති රෝග ගහදෝස මසේස නින්ද
සබ්බන්තරාය භය දුස්සුපිනං අකන්තං
සංඝානුභාවපවරේන පයාතු නාසං

---

තමාට කියන විට 1. "මය්හං" යි ද
2. "මම" යි ද
3. "මේ" යි ද
4. "වරාන" යි ද
5. "පරික්ඛතොස්මි" යි ද යොදා ගත හැක



# මහා කස්සපත්ථේර බොජ්ඣංග

ඒවං මේ සුතං. ඒකං සමයං භගවා රාජගහේ විහරති, වේළුවනේ කලන්දකනිවාපේ. තේන ඛෝ පන සමයේන ආයස්මා මහා කස්සපෝ පිප්ඵලිගුහායං විහරති, ආබාධිකෝ දුක්ඛිතෝ බාළ්හගිලානෝ. අථ ඛෝ භගවා සායණ්හසමයං පතිසල්ලානා වුට්ඨිතෝ යේනායස්මා මහාකස්සපෝ තේනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තේ ආසනේ නිසීදි. නිසජ්ජ ඛෝ භගවා ආයස්මන්තං මහාකස්සපං ඒතදවෝච:

කච්චි? තේ කස්සප ඛමනීයං කච්චි? යාපනීයං කච්චි? දුක්ඛා වේදනා පටික්කමන්ති නෝ අභික්කමන්ති පටික්කමෝසානං පඤ්ඤායති නෝ අභික්කමෝති. න මේ භන්තේ ඛමනීයං න යාපනීයං බාළ්හා මේ දුක්ඛා වේදනා අභික්කමන්ති නෝ පටික්කමන්ති, අභික්කමෝසානං පඤ්ඤායති නෝ පටික්කමෝති.



සත්තිමේ කස්සප, බොජ්ඣඞ්ගා මයා සම්මදක්ඛාතා භාවිතා බහුලීකතා අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තන්ති. කතමේ සත්ත? සති සම්බොජ්ඣඞ්ගෝ ඛෝ කස්සප, මයා සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති. ධම්මවිචය සම්බොජ්ඣඞ්ගෝ ඛෝ කස්සප මයා සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති. විරිය සම්බොජ්ඣඞ්ගෝ ඛෝ කස්සප මයා සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති.







පීති සම්බොජ්ඣංගෝ භෝ කස්සප, මයා සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති. පස්සද්ධි සම්බොජ්ඣංගෝ භෝ කස්සප, මයා සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති. සමාධි සම්බොජ්ඣංගෝ භෝ කස්සප, මයා සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති. උපෙක්ඛා සම්බොජ්ඣංගෝ භෝ කස්සප, මයා සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති. ඉමේ භෝ



කස්සප, සත්ත බොජ්ඣඞ්ගා මයා සම්මදක්ඛාතා භාවිතා බහුලීකතා අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තන්ති. තග්ඝ භගව, බොජ්ඣඞ්ගා තග්ඝ සුගත, බොජ්ඣඞ්ගාති. ඉදමවෝච භගවා. අත්තමනෝ ආයස්මා මහාකස්සපෝ භගවතෝ භාසිතං අභිනන්දි. උට්ඨා හිචායස්මා මහාකස්සපෝ තම්හා ආබාධා. තථා පහීනෝ චායස්මතෝ මහාකස්සපස්ස සෝ ආබාධෝ අහෝසීති.



# මහා මොග්ගල්ලානත්ථේර බොජ්ඣංග

ඒවං මේ සුතං. ඒකං සමයං භගවා රාජගහේ විහරති, වේළුවනේ කලන්දකනිවාපේ. තේන ඛෝ පන සමයේන ආයස්මා මහා මොග්ගල්ලානෝ ගිජ්ඣකූටේ පබ්බතේ විහරති, ආබාධිකෝ දුක්ඛිතෝ බාළ්හගිලානෝ. අථ ඛෝ භගවා සායණ්හසමයං පතිසල්ලානා වුට්ඨිතෝ යේනායස්මා මහා මොග්ගල්ලානෝ තේනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තේ ආසනේ නිසීදි. නිසජ්ජ ඛෝ භගවා ආයස්මන්තං මහා මොග්ගල්ලානං ඒතදවෝච:

කච්චි? තේ මොග්ගල්ලාන ඛමනීයං කච්චි?





යාපනීයං, කච්චි? දුක්ඛා වේදනා පටික්කමන්ති නෝ අභික්කමන්ති, පටික්කමෝසානං පඤ්ඤායති නෝ අභික්කමෝති. න මේ භන්තේ, කමනීයං, න යාපනීයං, බාළ්හා මේ දුක්ඛා වේදනා අභික්කමන්ති නෝ පටික්කමන්ති, අභික්කමෝසානං පඤ්ඤායති නෝ පටික්කමෝති. සත්තිමේ මොග්ගල්ලාන, බොජ්ඣඞ්ගා මයා සම්මදක්ඛාතා භාවිතා බහුලීකතා අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තන්ති. කතමේ සත්ත?







සති සම්බොජ්ඣඞ්ගෝ බෝ මොග්ගල්ලාන මයා සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති. ධම්මවිචය සම්බොජ්ඣඞ්ගෝ බෝ මොග්ගල්ලාන මයා සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති. විරිය සම්බොජ්ඣඞ්ගෝ බෝ මොග්ගල්ලාන මයා සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති.

පීති සම්බොජ්ඣඞ්ගෝ බෝ මොග්ගල්ලාන මයා





සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති. පස්සද්ධි සම්බොජ්ඣඞ්ගෝ බෝ මොග්ගල්ලාන මයා සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති. සමාධි සම්බොජ්ඣඞ්ගෝ බෝ මොග්ගල්ලාන මයා සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති. උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගෝ බෝ මොග්ගල්ලාන මයා සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති.

ඉමේ බෝ මොග්ගල්ලාන. සත්ත බොජ්ඣඞ්ගා මයා සම්මදක්ඛාතා භාවිතා



බහුලීකතා අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තන්ති. තග්ඝ භගව, බොජ්ඣඞ්ගා තග්ඝ සුගත, බොජ්ඣඞ්ගාති. ඉදමවෝච භගවා. අත්තමනෝ ආයස්මා මහාමොග්ගල්ලානෝ භගවතෝ භාසිතං අභිනන්දි. උට්ඨාහිචායස්මා මහාමොග්ගල්ලානෝ තම්හා ආබාධා. තථා පහීනෝ චායස්මතෝ මහාමොග්ගල්ලානස්ස සෝ ආබාධෝ අහෝසීති.

# මහාචුන්දත්ථේරබොජ්ඣංග

ඒවං මේ සුතං. ඒකං සමයං භගවා රාජගහේ විහරති, වේළුවනේ කලන්දකනිවාපේ. තේන ඛෝ පන සමයේන භගවා ආබාධිකෝ හෝති දුක්ඛිතො බාළ්හගිලානෝ. අථ ඛෝ ආයස්මා මහාචුන්දෝ සායණ්හසමයං පතිසල්ලානා වුට්ඨිතෝ යේන භගවා තේනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා ඒකමන්තං නිසීදි. ඒකමන්තං නිසින්නං ඛෝ ආයස්මන්තං මහාචුන්දං භගවා ඒතදවෝච.



පටිභන්තු තං චුන්ද බොජ්ඣඞ්ගාති. සත්තිමේ භන්තේ බොජ්ඣඞ්ගා භගවතා සම්මදක්ඛාතා භාවිතා බහුලීකතා අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තන්ති. කතමේ සත්ත? සති සම්බොජ්ඣඞ්ගෝ ඛෝ භන්තේ භගවතා සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති. ධම්මවිචය සම්බෝජ්ඣඞ්ගෝ ඛෝ භන්තේ භගවතා සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති. විරිය සම්බොජ්ඣඞ්ගෝ ඛෝ භන්තේ භගවතා සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති.

පීති සම්බොජ්ඣඞ්ගෝ ඛෝ භන්තේ භගවතා සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති.





පස්සද්ධි සම්බොජ්ඣඞ්ගෝ භෝ භන්තේ භගවතා සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති. සමාධි සම්බොජ්ඣඞ්ගෝ භෝ භන්තේ භගවතා සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති.

උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගෝ භෝ භන්තේ භගවතා සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති. ඉමේ භෝ භන්තේ සත්ත බොජ්ඣඞ්ගා භගවතා සම්මදක්ඛාතා භාවිතා බහුලීකතා අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තන්ති. තග්ඝ චුන්ද බොජ්ඣඞ්ගා, තග්ඝ චුන්ද බොජ්ඣඞ්ගාති. ඉදමවෝචායස්මා මහාචුන්දෝ. සමනුඤ්ඤො සත්ථා අහෝසි. වුට්ඨාහි ච භගවා තම්හා ආබාධා. තථා පහීනෝ ච භගවතෝ සෝ ආබාධෝ අහෝසීති.

# බෝධ්‍යංගයන්හි ඇති රෝග සුව කිරීමේ බලය

බෝධ්‍යංග ධර්මවල රෝග සුව කිරීමේ ශක්තියක් ඇති බැවින් අද දක්වා රෝග සුව කරවන පිරිත් වශයෙන් ඒ සූත්‍ර ධර්ම භාවිත කරනු ලැබේ. බෝධ්‍යංග ධර්ම ගැන දැනීම ඇති ඒවා වඩන පින්වතුන්ට රෝගාතුර වූ අවස්ථාවල දී බෝධ්‍යංග ධර්ම ඇසීමෙන් බොහෝ ගුණ ලැබිය හැකි ය. රෝගී වූ අවස්ථාවන්හි දී රෝග සුව කිරීම සඳහා බොජ්ඣඞ්ග පිරිත කියන්නට පුරුදු කරගැනීම හොඳ ය. යෝගාවචරයකු විසින් කියන පිරිතෙන් සාමාන්‍ය කෙනෙකු කියන පිරිතකට වඩා ගුණ ලැබෙන්නේ ය.

# බොජ්ඣංග පිරිත කිය යුතු ආකාරය

මේ බොජ්ඣඞ්ග පිරිත්, පිරිත් පොතේ ඇත්තේ තථාගතයන් වහන්සේ විසින් කාශ්‍යප තෙරුන් වහන්සේ අමතා උන් වහන්සේට දේශනය කළ සැටියට හා මුගලන් තෙරුන් වහන්සේ අමතා දේශනය කළ සැටියටත්, චුන්ද තෙරුන් වහන්සේ විසින් බුදුන් වහන්සේ අමතා දේශනය කළ සැටියටත් ය. බොහෝ දෙනා රෝගීන්ට ඒ සූත්‍ර ධර්ම, පොතේ ඇති සැටියට ම දේශනය කරති. බොජ්ඣඞ්ග පිරිත් එසේ දේශනය කිරීම නිෂ්ඵල නො වෙතත් රෝගීන්ට දේශනය කළ යුතු වඩා හොඳ ක්‍රමය එය නො වේ. වඩා හොඳ ක්‍රමය නම් රෝගියා ගේ නම පිරිතට යොදා තමන් කරන දේශනයක් සැටියට පිරිත කීම ය. රෝගියා ගේ නම පිරිතට යොදා කීම අපහසු නම් ආවුසො, භන්තෙ, උපාසක, උපාසිකෙ යනාදි කාහටත් යෙදිය හැකි ආමන්ත්‍රණ වචන යොදා පිරිත කිය යුතු ය. රෝගියා ගේ නම උපතිස්ස නම් පිරිත මෙසේ යොදා කිය යුතු ය.

සත්තිමෙ උපතිස්ස බොජ්ඣඞ්ගා භගවතා සම්මදක්ඛාතා භාවිතා බහුලීකතා අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තන්ති. කතමෙ සත්ත?

සතිසම්බෝජ්ඣඞ්ගෝ ඛෝ උපතිස්ස භගවතා සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති.

ධම්මවිචයසම්බෝජ්ඣඞ්ගෝ ඛෝ උපතිස්ස භගවතා සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති.

විරියසම්බෝජ්ඣඞ්ගෝ ඛෝ උපතිස්ස -පෙ-
පීතිසම්බෝජ්ඣඞ්ගෝ ඛෝ උපතිස්ස -පෙ-
පස්සද්ධිසම්බෝජ්ඣඞ්ගෝ ඛෝ උපතිස්ස -පෙ-
සමාධිසම්බෝජ්ඣඞ්ගෝ ඛෝ උපතිස්ස -පෙ-
උපෙක්ඛාසම්බෝජ්ඣඞ්ගෝ ඛෝ උපතිස්ස -පෙ-

ඉමෙ ඛෝ උපතිස්ස සත්ත බොජ්ඣඞ්ගා භගවතා සම්මදක්ඛාතා භාවිතා බහුලීකතා අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තන්ති.



පැවිද්දකුට පිරිත කියන කල්හි නම යොදා කීම අපහසු නම්, රෝගියා තමාට වැඩිමහලු කෙනෙක් වේ නම් 'සත්තිමෙ භන්තෙ බොජ්ඣඞ්ගා' යනාදින් භන්තෙ යන වචනය යොදා පිරිත කිය යුතු ය. රෝගියා නවකයෙක් වේ නම් 'සත්තිමෙ ආවුසො බොජ්ඣඞ්ගා' යනාදින් ආවුසො යන ආලපන වචනය යොදා පිරිත කියනු. රෝගියා ගිහි පුරුෂයෙක් නම් 'සත්තිමෙ උපාසක බොජ්ඣඞ්ගා' යනාදින් උපාසක යන සාධාරණ වචනය යොදා පිරිත කියනු. ස්ත්‍රියක නම් උපාසිකෙ යන සාධාරණ වචනය යොදා පිරිත කියනු. රෝගියා ළදරුවෙක් නම් 'සත්තිමෙ කුමාර බොජ්ඣඞ්ගා' යනාදි වශයෙන් ද ළදැරියක නම් 'සත්තිමෙ කුමාරිකෙ බොජ්ඣඞ්ගා' යනාදි වශයෙන් ද පිරිත කිය යුතු ය.



# බෝධි පූජා සහිත දෛනික තෙරුවන් වන්දනාව







# බුද්ධ වන්දනාව සහ බෝධි වන්දනාව

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

බුද්ධං සරණං ගච්ඡාමි
ධම්මං සරණං ගච්ඡාමි
සංඝං සරණං ගච්ඡාමි

දුතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි
දුතියම්පි ධම්මං සරණං ගච්ඡාමි
දුතියම්පි සංඝං සරණං ගච්ඡාමි

තතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි
තතියම්පි ධම්මං සරණං ගච්ඡාමි
තතියම්පි සංඝං සරණං ගච්ඡාමි

පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි
අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි
කාමේසු මිච්ඡාචාරා වේරමණී සික්ඛාපදං සමාදියාමි
මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි
පිසුණාවාචා වේරමණී සික්ඛාපදං සමාදියාමි
ඵරුසාවාචා වේරමණී සික්ඛාපදං සමාදියාමි
සම්පප්ඵලාපා වේරමණී සික්ඛාපදං සමාදියාමි

මිච්ඡාජීවා වේරමණී සික්ඛාපදං සමාදියාමි

මේ තිසරණ සහිතවූ ආජීව අට්ඨමක සීලය මාර්ගඵල නිවන් පිණිසම හේතු වේවා !

සම්පූරිතා පමිත පාරමිතා බලේන
විද්ධංසියෝ බිල කිලේස සමෝහ ජාලං
තේනේව ලද්ධ අරහං අරහෝති නාමං
වන්දාමි බුද්ධමමලං හදයේ ඨපෙත්වා

නමෝ තස්ස හගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

ඉතිපි සෝ හගවා අරහං සම්මා සම්බුද්ධෝ විජ්ජාචරණ සම්පන්නෝ සුගතෝ ලෝක විදූ අනුත්තරෝ පුරිසදම්ම සාර්ථී සත්ථා දේවමනුස්සානං බුද්ධෝ හගවාති.

බුද්ධං ජීවිතං යාව නිබ්බානං සරණං ගච්ජාමි. යේච බුද්ධා අතිතාච යේච බුද්ධා අනාගතා. පච්චුප්පන්නාච යේ බුද්ධා අහං වන්දාමි සබ්බදා. නත්ථිමේ සරණං අඤ්ඤං බුද්ධෝ මේ සරණං වරං ඒතේන සච්චවජ්ජේන හෝතු මේ ජයමංගලං උත්තමංගේන වන්දේහං පාදපංසුවරුත්තමං බුද්ධෙ යෝ බලිතෝ දෝසෝ බුද්ධෝ බමතු තං මමං

ස්වාක්ඛාතෝ හගවතා ධම්මෝ සන්දිට්ඨිකෝ අකාලිකෝ ඒහි පස්සිකෝ ඕපනයිකෝ පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහිති.

ධම්මං ජීවිතං යාව නිබ්බානං සරණං ගච්ඡාමි. යේච ධම්මා අතීතාච යේච ධම්මා අනාගතා පච්චුප්පන්නාච යේ ධම්මා අහං වන්දාමි සබ්බදා නත්ථි මේ සරණං අඤ්ඤං ධම්මෝ මේ සරණං වරං ඒතේන සච්චවජ්ජේන හෝතු මේ ජය මංගලං උත්තමංගේන වන්දේහං ධම්මංචතිවිධං වරං ධම්මේ යෝ ඛලිතෝ දෝසෝ ධම්මෝ ඛමතු තං මමං

සුපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ
උජුපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ
ඤායපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ
සාමීචිපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ
යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨ පුරිස පුග්ගලා ඒස භගවතෝ සාවකසංඝෝ ආහුනෙය්‍යෝ පාහුනෙය්‍යෝ දක්ඛිණෙය්‍යෝ අඤ්ජලිකරණීයෝ අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්සාති.

සංඝං ජීවිතං යාව නිබ්බානං සරණං ගච්ඡාමි යේච සංඝා අතීතාච යේච සංඝා අනාගතා පච්චුප්පන්නාච යේ සංඝා අහං වන්දාමි සබ්බදා නත්ථි මේ සරණං අඤ්ඤං සංඝෝ මේ සරණං වරං ඒතේන සච්ච වජ්ජේන හෝතු මේ ජයමංගලං උත්තමංගේන වන්දේහං සංඝංච තිවිධෝත්තමං සංඝේ යෝ ඛලිතෝ දෝසෝ සංඝෝ ඛමතු තං මමං

දුක්ඛේ ඤාණං බුද්ධ ඤාණං
දුක්ඛ සමුදයේ ඤාණං බුද්ධ ඤාණං





දුක්ඛ නිරෝධෙ ඤාණං බුද්ධ ඤාණං
දුක්ඛ නිරෝධගාමිනී පටිපදාය ඤාණං බුද්ධ ඤාණං
අත්ථපටිසම්හිදේ ඤාණං බුද්ධ ඤාණං
ධම්ම පටිසම්හිදේ ඤාණං බුද්ධ ඤාණං
නිරුත්ති පටිසම්හිදේ ඤාණං බුද්ධ ඤාණං
පටිහාන පටිසම්හිදේ ඤාණං බුද්ධ ඤාණං
ඉන්ද්‍රිය පරෝ පරියත්තේ ඤාණං බුද්ධ ඤාණං
ආසයානුසයේ ඤාණං බුද්ධ ඤාණං
යමක පාටිහාරියේ ඤාණං බුද්ධ ඤාණං
මහා කරුණා සමාපත්තියා ඤාණං බුද්ධ ඤාණං
සබ්බඤ්ඤුත ඤාණං බුද්ධ ඤාණං
අනාවරණ ඤාණං බුද්ධ ඤාණං

ඉමේහි බුද්ධ ඤාණේහි සමන්නාගතං සම්මා සම්බුද්ධං තං සිරියා නමාමි.

සෝ හගවා ඉතිපි අරහං
අරහං වත සෝ හගවා
අරහං තං සරණං ගච්ඡාමි
අරහං තං සිරසා නමාමි

සෝ හගවා ඉතිපි සම්මා සම්බුද්ධෝ
සම්මාසම්බුද්ධෝ වතසෝ හගවා
සම්මා සම්බුද්ධං තං සරණං ගච්ඡාමි
සම්මා සම්බුද්ධං තං සිරසා නමාමි.



සෝ භගවා ඉතිපි විජ්ජාවරණ සම්පන්නෝ
විජ්ජාවරණ සම්පන්නෝවත සෝභගවා
විජ්ජාවරණ සම්පන්නං තං සරණං ගච්ජාමි
විජ්ජාවරණ සම්පන්නං තං සිරසා නමාමි.

සෝ භගවා ඉතිපි සුගතෝ
සුගතෝ වත සෝ භගවා
සුගතං තං සරණං ගච්ජාමි
සුගතං තං සිරසා නමාමි

සෝ භගවා ඉතිපි ලෝකවිදූ
ලෝක විදූවත සෝ භගවා
ලෝක විදූං තං සරණං ගච්ජාමි
ලෝක විදූං තං සිරසා නමාමි

සෝ භගවා ඉතිපි අනුත්තර පුරිස දම්ම සාරථී
අනුත්තර පුරිසදම්ම සාරථී වත සෝ භගවා
අනුත්තර පුරිසදම්ම සාරථිං තං සරණං ගච්ජාමි
අනුත්තර පුරිසදම්ම සාරථිං තං සිරසා නමාමි

සෝ භගවා ඉතිපි සත්ථා දේව මනුස්සානං
සත්ථා දේව මනුස්සානං වත සෝ භගවා
සත්ථා දේවමනුස්සානං තං සරණං ගච්ජාමි
සත්ථා දේවමනුස්සානං තං සිරසා නමාමි

සෝ භගවා ඉතිපි බුද්ධෝ
බුද්ධෝ වත සෝ භගවා
බුද්ධං තං සරණං ගච්ඡාමි
බුද්ධං තං සිරසා නමාමි

සෝ භගවා ඉතිපි භගවා
භගවා වත සෝ භගවා
භගවං තං සරණං ගච්ඡාමි
භගවං තං සිරසා නමාමි.

මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ කෙලෙසුන් කෙරෙන් දුරු වූ සේක. කෙලෙස් සතුරන් නැති කළ සේක. සියලූ පාපයන්ගෙන් මිදුන සේක. රහසින්වත් පව් නොකළ සේක. සියලූ ලෝ වැසියන්ගේ ආමිස පූජා ප්‍රතිපත්ති පූජා සියල්ලටම සුදුසු වන සේක.

බුදුරජාණන් වහන්සේගේ දාන පාරමිතාව මහා ආශ්චර්යය. පාරමී පූරන සමයේ

අඹුදරුවන් දන්දුන් සේක.
මහාරාජ්‍ය දන්දුන් සේක.
ඇස් උපුටා දන්දුන් සේක.

බුදුරජාණන් වහන්සේගේ කරුණා ගුණය මහා ආශ්චර්යය. කෝටියක් මව්වරුන්ගේ කෝටියක් පියවරුන්ගේ කරුණා ගුණය එක පිඩක් කළද බුදුරජාණන් වහන්සේගේ කරුණා ගුණයට උපමා කළ නොහැක.





මෙසේ අනන්ත වූ අප්‍රමාණ ගුණ ඇත්තා වූ බුදුරජාණන් වහන්සේ මහා භාග්‍ය ඇති සේක. බුදුරජාණන් වහන්සේ සැරියුත් තෙරුන් වැනි වූ වැඩිමහල් වූ පුතණු කෙනෙකුන් ලද සේක.

බුදුරජාණන් වහන්සේ මුගලන් තෙරුන් වැනි වූ ඍද්ධි බල ඇත්තාවූ පුතණු කෙනෙකුන් ලද සේක.

බුදුරජාණන් වහන්සේ මහා කාශ්‍යප තෙරුන් වැනිවූ ධූතංග ධාරිවූ පුතණු කෙනෙකුන් ලද සේක.

බුදුරජාණන් වහන්සේ උපාලි තෙරුන් වැනිවූ විනය දම් දන්නා වූ පුතණු කෙනෙකුන් ලද සේක.

බුදුරජාණන් වහන්සේ රාහුල තෙරුන් වැනි වූ සුවච කීකරු වූ පුතණු කෙනෙකුන් ලද සේක.

බුදුරජාණන් වහන්සේ කුමාර කස්සප තෙරුන් වැනි වූ මිහිරි හඬින් දම් දෙසනා පුතණු කෙනෙකුන් ලද සේක.

බුදුරජාණන් වහන්සේ අනද තෙරුන් වැනි වූ උපස්ථායක වූ පුතණු කෙනෙකුන් ලද සේක.

බුදුරජාණන් වහන්සේ අනේපිඩු සිටු වැනි වූ මහ උවසුවන් ලද සේක.

බුදුරජාණන් වහන්සේ විශාඛා වැනි වූ මහ උවැසියන් ලද සේක.

බුදුරජාණන් වහන්සේ සක් දෙව් රජු වැනි වූ ගෝල බාලයින් ලද සේක.

බුදුරජාණන් වහන්සේ බුද්ධත්වය වැනි වූ සම්මාන තන තුරු ලද සේක.

මෙසේ අනන්තවූ අප්‍රමාණ ගුණ ඇත්තා වූ අසමවූ අසමසම වූ දෙවියන්ට දෙවි වූ මට ම ස්වාමි වූ මගේම බුදු මැණියන් වූ මගේම බුදු පියාණන් වූ මොහඳුරට ළහිරුමඬලක් වූ කෙලෙස් ගින්නට මහා මේඝයක් වූ ගමනින් ශාන්ත වූ පැවැත්මෙන් සංවර වූ අනාථ නාථ වූ අසරණ සරණ වූ අග්‍ර දක්ෂිණෙය්‍ය වූ බුදුරජාණන් වහන්සේ ට මේ පහන් පූජා කරමි පූජා වේවා. මේ සුවඳ දුම් පූජා කරමි පූජා වේවා. මේ සුවඳ මල් පූජා කරමි පූජා වේවා. මේ සිසිල් පැන් පූජා කරමි. පූජා වේවා. මේ ගිලන්පස පූජා කරමි පූජා වේවා. මේ දෑහැත් පූජා කරමි. පූජා වේවා.

මේ සියලූ පූජාවෝ නිර්වාණ ශාන්තිය පතා සංසාරදුකින් අත්මිදීම පතා බුදුරජාණන් වහන්සේට පූජා කරමි පූජා වෙත්වා ! පූජා වෙත්වා ! පූජා වෙත්වා !!!

නමාමි සුගතං බුද්ධං ලෝක ජේට්ඨං නරාසභං
නමාමි සුගතං ධම්මං නිය්‍යානිකං සුදේසිතං

115
නමාමි සුගතං සංඝං පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
නමාමි සුගතං බෝධිං අස්වත්ථං ලෝක පූජිතං
වීත තණ්හං වීත දෝසං වීත මෝහං අනාසවං
වන්දේ නිපුණ සම්බුද්ධං අනන්ත නය දේසිතං

වන්දාමි චේතියං සබ්බං
සබ්බඨානේසු පතිට්ඨිතං
සාරීරිකධාතු මහා බෝධිං
බුද්ධ රූපං සකලං සදා

මහියංගණං නාගදීපං
කල්‍යාණං පද ලාඤ්ඡනං
දිවා ගුහං දීඝවාපී
චේතියංච මුතිංගණං
තිස්ස මහා විහාරංච
බෝධිං මරිච වට්ටියං
සොණ්ණමාලි මහා චේතිං
ථූපාරාම භයාගිරිං
ජේතවනං සේල චේතියං
තථා කාචර ගාමකං
ඒතේ සෝළස ඨානානි
අහං වන්දාමි සබ්බදා

ඝනසාරප්පදිත්තේන
දීපේන තම ධංසිනා

තිලෝක දීපං සම්බුද්ධං
පූජයාමි තමෝනුදං

සුගන්ධිකාය වදනං
අනන්ත ගුණ ගන්ධිනා
සුගන්ධිනාහං ගන්ධේන
පූජයාමි තථාගතං

වණ්ණගන්ධ ගුණෝපේතං
ඒතං කුසුම සන්තතිං
පූජයාමි මුනින්දස්ස
සිරිපාද සරෝරුහේ

සුගන්ධං සීතලං කප්පං
පසන්න මධුරං සුභං
පානීයමේතං භගවා
පතිගණ්හාතු මුත්තමං

සේවිතං ධම්ම රාජේන
පත්තුං සම්බෝධි මුත්තමං
පූජේමි බෝධි රාජානං
පුප්ඵේනේතේන සාදරං

සේවිතං ධම්ම රාජේන
පත්තුං සම්බෝධි මුත්තමං
පූජේමි බෝධි රාජානං
දීපේනේතේන සාදරං



සේවිතං බුද්ධ සෙට්ඨේන
පත්තුං සම්බෝධි මුත්තමං
පූජේමි බෝධිරාජානං
ධූපේනේතේන සාදරං

සුදුබුදුරුස් දහරින් ලොව නාවා
බුදුහාමුදුරුවො හොඳ බණ කීවා
පුදමි පහන් මම සිරිපද ගාවා
බිඳ බව දුක සැනසුම හිමි වේවා

මේ මල් මෙන්සිත පිරිසිදු වේවා
මේ මල් මෙන් කය ගැන වැට හේවා
මේ මල් මුනිඳුට පූජා වේවා
මේ මල් සේ නිවනට යොමු වේවා

ගුණ දම් රස අපමණ බව දනිමි
නිබඳ අමාගුණ සයුරේ ගිලෙමි
මහඳ සිසිල් ගඳ කිළියක් කරමි
සුවඳ දුමින් මගෙ බුදුහිමි පුදමි

අධිවාසේතු නෝ හන්තේ
ගිලාන පච්චයං ඉමං
අනුකම්පං උපාදාය
පතිගණ්හාතු මුත්තමං

අධිවාසේතු නෝ භන්තේ
තාම්බූලං පරිකප්පිතං
අනුකම්පං උපාදාය
පතිගණ්හාතු මුත්තමං

කායේන වාචා චිත්තේන
පමාදේන මයා කතං
අච්චයං ඛමමේ භන්තේ
භූරි පඤ්ඤ තථාගත

කායේන වාචා චිත්තේන
පමාදෙන මයා කතං
අච්චයං ඛම මේ ධම්ම
සන්දිට්ඨික අකාලික

කායේන වාචා චිත්තේන
පමාදේන මයා කතං
අච්චයං ඛම මේ සංඝ
සුපටිපන්න අනුත්තර

අනන්ත සසර පටන් මේ මොහොත දක්වා මාගේ සිත කය වචන යන තිදොරින් සිදු වූණා වූ සියලු දෝෂයනට බුද්ධ රත්නයෙන් ද ධම්ම රත්නයෙන්ද සංඝරත්නයෙන් ද මට සමාව ලැබේවා !

දෙවනුවද මට සමාව ලැබේවා !
තෙවනුවද මට සමාව ලැබේවා !!

ඉදං මේ පුඤ්ඤං ආසවක්ඛයා වහං හෝතු සබ්බ දුක්ඛා පමුඤ්චතු.

මා විසින් මේ ජීවිත කාලය තුළ දී රැස් කළා වූ දානමය සීලමය වන්දනාමය බුද්ධ පූජාමය බෝධි වන්දනාමය සුවිසි ගුණ මනසි කාරමය සියලු පුණ්‍ය ධර්මයෝ මාගේ දෙමාපියන්ටද මාගේ ගුරු වරයින්ට ද මාගේ වැඩි හිටියන්ට ද සියලු දෙනාට ද අයිති වේවා.

මම ද සියල්ලන්ගේම සියලු පුණ්‍ය ධර්මයන් සාදර ගෞරවයෙන් ආදර භක්තියෙන් අනුමෝදන් වෙමි. මටද මේ සියලු පින් බලයෙන් ජරා මරණ සංසාර දුකින් අත් මිදී නිර්වාණ සුවයම අවබෝධ වේවා නිවන් දකිම්වා.

## බෝධි පූජාකවි

රන්වන් පාටින් දලුලන බෝධිය
නිල්වන් පාටින් කොළලන බෝධිය
ගෞතම මුනිඳුන් පිටදුන් බෝධිය
අපිත් වදිමු ජය සිරිමහ බෝධිය



දඹදිව් තලයේ හටගත් බෝධිය
සිරිලංකාවට වැඩමෙව් බෝධිය
ගෞතම මුනිඳුන් පිට දුන් බෝධිය
අපිත් වදිමු ජය සිරිමහ බෝධිය

දඹදිව් තලයේ හටගත් බෝධිය
සහමිත් තෙරණිය ගෙන වැඩි බෝධිය
ගෞතම මුනිඳුන් පිටදුන් බෝධිය
අපිත් වදිමු ජයසිරි මහ බෝධිය

දඹදිව් තලයේ හටගත් බෝධිය
මහමෙව්නාවේ රෝපිත බෝධිය
ගෞතම මුනිඳුන් පිටදුන් බෝධිය
අපිත් වදිමු ජය සිරිමහ බෝධිය

දෙව්ලොව දෙවියන් පුද කළ බෝධිය
නාලොව සතියක් පුදලද බෝධිය
දෙනෝදහක් දෙන වදිනා බෝධිය
අපිත් වදිමු ජය සිරිමා බෝධිය

අනුරපුරේ සිට ගෙන ආ බෝධිය
මේ අරමේ වැඩ හිදිනා බෝධිය
දෙනෝ දහක් දෙන වදිනා බෝධිය
අපිත් වදිමු ජය සිරිමා බෝධිය

අනුරපුරේ වැඩ හිදිනා බෝධිය
රත්වැට අතරින් පෙනෙනා බෝධිය



දෙනෝ දහක් දෙන වදිනා බෝධිය
අපිත් වදිමු ජය සිරිමා බෝධිය

මම මේ මළුවට එනවා යනවා
බෝමුල් බෝපත් මට පෑගෙනවා
සමාවදී මගෙ පව් අරවනවා
බෝ රජුනේ මට අවසර දෙනවා

උඩමළුවේ බෝරජු වැජඹෙනවා
දෙවැනි මළුවේ මල්පහන් දිලෙනවා
වැලි මළුවේ මහ සෙනග වදිනවා
මතු මත්තේ අපි නිවන් දකිනවා

සුදු බුදු රුස් දහරින් ලොව නාවා
බුදු හාමුදුරුවො හොඳ බණ කීවා
පුදමි පහන් මම සිරිපද ගාවා
බිඳ බව දුක සැනසුම හිමි වේවා

මේ මල් පරවෙන බව සිහි වේවා
මේ මල් මෙන් කය ගැන වැට හේවා
මේ මල් මුනිඳුට පූජා වේවා
මේ මල් සේ නිවනට යොමු වේවා

ගුණ දම් රස අපමණ බව දනිමි
නිබඳ අමාගුණ සයුරේ ගිලෙමි
මහද සිසිල් ගඳ කිළියක් කරමි
සුවඳ දුමින් මගෙ බුදුහිමි පුදමි





බුදුගුණ අරහං නව ගුණ වේවා
අරහං නව ගුණ හදතුල වේවා
මරණෙදි මට කිසි බියක් නො වේවා
මරණෙදි මට බුදු ගුණසිහි වේවා

පුන් සඳ මෙන් කඳු මුදුනෙන් දිස්වෙන
රත්වත් සිවුරක් පොරවා රැස්දෙන
තුන් ලොවටම මෙත් කරුණා වස්සන
අන්න බලන් බුදුසමිඳුගෙ ලස්සන

සම්මා සම්බුදු සමිඳුගේ මුහුණේ
ලස්සන වෙන කිසි මලෙකත් නැතේ
අපි පුදදෙනමල් මිටිමිටි ගානේ
සමිඳුගෙ ඉදිරියෙ පරවෙනවා නේ

නෙත සැනසිල්ල බුදුහිමිරුව දැකිමය
ගත සැනසිල්ල බුදුහිමිහට වැදිමය
සිත සැනසිල්ල බුදුහිමි ගුණ සිතිමය
බව සැනසිල්ල හිමිගත් මග ගැනිමය

කරදරමයි ජීවිතයක හැමදාම
මරණයටයි ටික ටිකවත් ළංවීම
පින පමණයි තරමකවත් සැහීම
නිවන තමයි අපකාටත් සැනසීම

නමස්කාරවේවා බුදුරුවනට
සැමදා මම බුදු සරණ යමි
නමස්කාරවේවා දම් රුවනට
සැමදා මම දම් සරණ යමි
නමස්කාරවේවා සහරුවනට
සැමදා මම සහ සරණ යමි
නමස්කාරවේවා දෙවනුත් තෙවනුත්
සැමදා තිසරණ සරණ යමි

යමෙක් ලොවේ සුවපත් වූවෝ
නම් ඒ හැම බුදු හිමි සරණ ගියෝ
යමෙක් ලෝවේ සුවපත් වූවෝ
නම් ඒ හැම සදහම් සරණ ගියෝ
යමෙක් ලොවේ සුවපත් වූවෝ
නම් ඒ හැම මහසහ සරණ ගියෝ
යමෙක් ලොවේ සුවපත් වූවෝ
නම් ඒ හැම තිසරණ සරණ ගියෝ

යමෙක් වනාහි දුක් නැසූවෝ
නම් ඒ හැම බුදු හිමි සරණ ගියෝ
යමෙක් වනාහි දුක් නැසූවෝ
නම් ඒ හැම සදහම් සරණ ගියෝ
යමෙක් වනාහි දුක් නැසූවෝ
නම් ඒ හැම මහ සහ සරණ ගියෝ
යමෙක් වනාහි දුක් නැසූවෝ
නම් ඒ හැම තිසරණ සරණ ගියෝ

සව්සත බුදුහිමි සරණ ගොසින් හැම
දුකින් මිදී සුවපත් වේවා
සව්සත සදහම් සරණ ගොසින් හැම
දුකින් මිදී සුපවත් වේවා
සව්සත මහසහ සරණ ගොසින් හැම
දුකින් මිදී සුව පත් වේවා
සව්සත තිසරණ සරණ ගොසින් හැම
දුකින් මිදී සුවපත් වේවා

## කරණීය මෙත්ත සූත්‍රය

කරණීයමත්ථ කුසලේන
යංතං සන්තං පදං අභිසමෙච්ච
සක්කෝ උජූච සූජූච
සුවචෝචස්ස මුදූ අනතිමානී

සන්තුස්සකෝච සුභරෝච
අප්පකිච්චෝච සල්ලහුක වුත්ති
සන්තින්ද්‍රියෝච නිපකෝච
අප්පගබ්භෝ කුලේසු අනනුගිද්ධෝ

නචඛුද්දං සමාචරේ කිඤ්චි
යේන විඤ්ඤූපරේ උපවදෙය්‍යුං
සුඛිනෝ වා ඛේමිනෝ හොන්තු
සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා



යේ කේචි පාණ භූතත්ථි
තසාවාථාවරාවා අනවසේසා
දීඝා වා යේ මහන්තාවා
මජ්ඣිමාරස්සකාණුකථූලා

දිට්ඨාවා යේව අද්දිට්ඨා
යේව දූරේ වසන්ති අවිදූරේ
භූතා වා සම්භවේසීවා
සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා

න පරෝපරං නිකුබ්බේථ
නාතිමඤ්ඤේථ කත්ථචිනං කඤ්චි
බ්‍යාරෝසනා පටිඝ සඤ්ඤා
නාඤ්ඤමඤ්ඤස්ස දුක්ඛමිච්ඡෙය්‍ය

මාතා යථා නියං පුත්තං
ආයුසා ඒක පුත්ත මනුරක්ඛේ
ඒවම්පි සබ්බ භූතේසු
මානසං භාවයේ අපරිමාණං

මෙත්තං ච සබ්බ ලෝකස්මිං
මානසං භාවයේ අපරිමාණං
උද්ධං අධෝච තිරියංච
අසම්බාධං අවේරං අසපත්තං





තිට්ඨං චරං නිසින්නෝවා
සයානෝවා යාවතස්ස විගත මිද්ධෝ
ඒතං සතිං අධිට්ඨෙය්‍ය
බ්‍රහ්මමේතං විහාරං ඉධමාහු

දිට්ඨිංච අනුපගම්මසීලවා
දස්සනේන සම්පන්නෝ
කාමේසු විනෙය්‍ය ගේධං
නහිජාතු ගබ්භසෙය්‍යං පුනරේතීති.

## මෛත්‍රී භාවනාව

මම නිදුක් වෙම්වා, මම නිරෝගී වෙම්වා, මම සුවපත් වෙම්වා, මම දුකින් මදෙම්වා, මම නිවන් ලබම්වා.

මා මෙන් ම මාගේ මව් පියගුරුවර හිතවත්තයෝද මැදහත් සත්වයෝද වෛරී සත්වයෝද සියලු සත්වයෝද වෛර නැත්තෝ වෙත්වා, තරහ නැත්තෝ වෙත්වා, නපුරු අදහස් නැත්තෝ වෙත්වා, දුක් පීඩා නැත්තෝ වෙත්වා, නිදුක් වෙත්වා, නිරෝගී වෙත්වා, සුවපත් වෙත්වා, දුකින් මිදෙත්වා, නිවන් ලබත්වා.

මේ ගමෙහි ද මේ නගරයෙහි ද මේ ලක් දිව ද මේ දඹදිව් තලයෙහි ද මේ සක්වලෙහි ද වාසය කරන්නා වූ සියලු සත්වයෝ වෛර නැත්තෝ වෙත්වා,

තරහ නැත්තෝ වෙත්වා, තපුරු අදහස් නැත්තෝ වෙත්වා, දුක් පීඩා නැත්තෝ වෙත්වා, නිදුක් වෙත්වා, නිරෝගී වෙත්වා, සුවපත් වෙත්වා, දුකින් මිදෙත්වා, නිවන් ලබත්වා.

කිසිවෙක් කිසිවෙකුට වෛර නොකෙරෙත්වා, කිසිවෙක් කිසිවෙකුට නින්දා නොකෙරෙත්වා, කිසිවෙක් කිසිවෙකුට අවමන් නොකෙරෙත්වා, සියල්ලන්ම සියල්ලන්ගේම සැප කැමැත්තෝ වෙත්වා.

සිතකය වදනින් මෙත් ගුණ මතු වී
සාමය සමගිය ලෝ තුළ පැතිරී
සැමදෙන එකමවකගෙ දරු කැල සේ
සොම්නස් වෙත්වා සැන සෙත්වා

තුනුරුවන්ගේ අනන්ත සුවිසි මහ ගුණ බලයෙන් ලෝවැසි සියල්ලන්ටම සැනසිල්ල වේවා.

## මෛත්‍රී භාවනා කවි

මුණිඳු සරණ එක පිහිටම වේවා
උතුම් නිවන අවබෝධය වේවා
සුවච සුමුදු ඉදුගුණ ඇති වේවා
සියලු සතුන් ලොව සුවපත් වේවා



මානෙන් තොර තුටු සිත් ඇති වේවා
අනුනට කරදරයක් නො කෙරේවා
සැහැල්ලු ජීවිතයක් ඇති වේවා
සියලු සතුන් ලොව සුවපත් වේවා

සන්සුන් ඉඳුරන් නිති ඇති වේවා
සිහි නුවණින් කටයුතු ද කෙරෙවා
කුලමානෙන් දුසිත නොම වේවා
සියලු සතුන් ලොව සුවපත් වේවා

නැණැති දනන් වැණු ගුණ ඇති වේවා
පාපකෙලෙස් සිත් පහළ නො වේවා
සිතකය වචනය පිරිසිදු වේවා
සියලු සතුන් ලොව සුවපත් වේවා

බියපත් තැතිගත් සතුන්ද · වේවා
දිගුමහ සිරුරැති තේසත් වේවා
කෙලෙසුන් සුන්කළ රහතුන් වේවා
සියලු සතුන් ලොව සුවපත් වේවා

අහසෙහි දුරලහ ගොඩදිය වේවා
පෙනෙන නොපෙනෙනා පණුවන් වේවා
ඉපදුණ ඉපදෙන ගණනින් බෝවා
සියලු සතුන් ලොව සුවපත් වේවා

කිසිවෙකුහට වංචා නොකෙරේ වා
කිසිවෙකුහට අවමන් නොකෙරේ වා





කිසිවෙකුහට රිදුමක් නොකෙරේ වා
සියලු සතුන් ලොව සුවපත් වේ වා

එකම පුතුන් දිවි නොතකා බෝ වා
ඇල්මෙන් රකිනා මවසේ වේවා
මෙත්සිත සිල්බලයෙන් සුරැකේ වා
සියලු සතුන් ලොව සුවපත් වේවා

සක්මන් කරමින සිටගෙන වේවා
නොනිදා සැතපෙන හිඳගෙන වේවා
කොයි ඉරියව්වෙන් මෙත් පැතිරේ වා
සියලු සතුන් ලොව සුවපත් වේ වා

ලෞකික ආසාවෙන් දුරු වෙම් වා
ලොව්තුරු මග පල සැපත ලබම් වා
සසරෙහි උපදින දුකෙන් මිදෙම් වා
කෙලෙසුන් සුන්කර නිවන් දකිම් වා

එත්තාවතාව අම්හෙහි
සම්භතං පුඤ්ඤ සම්පදං
සබ්බේ දේවා අනුමෝදන්තු
සබ්බ සම්පත්ති සිද්ධියා

ආකාසට්ඨාච භුම්මට්ඨා
දේවානාගා මහිද්ධිකා
පුඤ්ඤං තං අනුමෝදිත්වා
චිරං රක්ඛන්තු ලෝක සාසනං





සම්බුද්ධ සාසනවරං යතිපුංගවංච
සම්පාලනාය පටිලද්ධ වරෝ යසස්සී
පුඤ්ඤානි මානී අනුමෝදිය වාසුදෙවෝ
පාලේතුමං සතත සාත හිතාවහන්තෝ

සම්බුද්ධ සාසනවරං ඉධ රෝහණස්මිං
සම්පාලනාය ජිනදත්ත වරෝ මහිද්ධී
පුඤ්ඤානුමෝදිය සළාණතා දේවරාජා
පාලේතුමං සතත සාතහිතා වහන්තෝ

සම්බුද්ධපාදවරලඤ්ඡන සෝභිතම්හි
වසෝ සමන්තගිරි මුද්ධනි දේවරාජා
පුඤ්ඤානුමෝදිය ඉදං සුමණාභිධානෝ
පාලේතුමං සතත සාත හිතාවහන්තෝ

ඉදං මේ ඤාතීනං හෝතු
සුඛිතා හොන්තු ඤාතයෝ

ඉදං මේ ඤාතීනං හෝතු
සුඛිතා හොන්තු ඤාතයෝ

ඉදං මේ ඤාතීනං හෝතු
සුඛිතා හොන්තු ඤාතයෝ

ඉදං මේ පුඤ්ඤං ආසවක්ඛයාවහං හෝතු
ඉදං මේ පුඤ්ඤං ආසවක්ඛයාවහං හෝතු
ඉදං මේ පුඤ්ඤං ආසවක්ඛයාවහං හෝතු

සබ්බ දුක්ඛා පමුඤ්චතු.

මා විසින් රැස් කළාවූ සීලමය, වන්දනාමය, බුද්ධ පූජාමය, බෝධි වන්දනාමය, සූවිසි ගුණ මනසිකාරමය, සියලු පුණ්‍ය ධර්මයෝ මාගේ දෙමාපියන්ටද මාගේ ගුරු වරුන්ටද මාගේ වැඩිහිටියන්ට ද සියලු දෙනාටද අයිති වෙත්වා. !

මම ද සියල්ලන්ගේම සියලු පුණ්‍ය ධර්මයන් සාදර ගෞරවයෙන් ආදර භක්තියෙන් අනුමෝදන් වෙමි. මට ද මේ සියලු පින් බලයෙන් ජරා මරණාදි සංසාර දුකින් අත් මිදී නිර්වාණ සුවයම අවබෝධ වේවා! නිවන් දකිම්වා !

## නවග්‍රහ සෙත් ශාන්තිය

අරහං බුදු ගුණෙන් මගේ ඉරුගෙ අපල දුරු වේවා
ලෙඩදුක් බිය නොවී කිසිත් සැපත සතුට ලං වේවා

සම්මා සම්බුද්ධ තෙදින් සඳුගෙ අපල දුරු වේවා
මාරක බාධක වැළකී මගේ පැතුම් ඉටු වේවා



විජ්ජාචරණෝ බලයෙන් අහහරු දොස් දුරු වේවා
වස විස ගිනි සතුරු විපත් මා වෙත ලං නොම වේවා

සුගතෝ බුදු ගුණෙන් මගේ බුද ගෙ අපල දුරුවේවා
ගුණ නුවණින් වැඩී සියලු සැප සම්පත් ඉතිරේවා

ලෝකවිදූ තෙදින් මගේ ගුරුගේ දෝස දුරු වේවා
සතුට සමාදානය මට නිරෝගි සුව වැඩි වේවා

අනුත්තරෝ බුදු ගුණයෙන් සිකුරු අපල දුරු වේවා
සිතුම්ණ වැනි රුවන් ගැබක ආයුෂ මගෙ වැඩි වේවා

පුරිස දම්ම සාරථී බල මහිමෙන් සැඩ සෙනසුරාගෙ
අකල විකල හූත දෝස ගැටුම් වැටුම් හා කොඩිවිණ

දුරුර සියලු මෙකී දෝස විලස සාදු ජය බොරුක
ජීන පඤ්ජරයක් වේවා සෙනසුරු දොස් දුරුවේවා

සත්ථා බුදු ගුණෙන් මගේ රාහු අපල ඉගිලේවා
යක්ෂ ප්‍රේත විණ බන්දන ආපසු පෙරළී යේවා

හගවා යන විදුරවියෙන් කේතු අපල නැති වේවා
මගේ කයට බසට සිතට සැපත සතුට වැඩි වේවා

මකර කුම්භ මිථුන තෙරුස මාරක බිය දුරු වේවා
කැපී කෝටියක්ම දෝස මට ජය මහ හෙළි වේවා
සිංහ මේෂ ධනු තුන් රුස බාධක බිය දුරු වේවා
තිසරණ සරණින් ජයසිරි සුබසෙත මට ලං වේවා





මීන කටක තුහුනු තෙරුස සැම ග්‍රහ දොස් දුරු වේවා
ජීවසිද්ධි බෙලෙන් මගේ බුදු සරණින් සූරුකේවා
වෘෂහ කන්‍ය තුලා තෙරුස සැම ග්‍රහ දොස් දුරුවේවා
දම් සරණින් මගේ අපල දුරු වී සිරිසෙත වේවා

රාහු කේතු රවි සඳු කුජ බුධ ගුරු කිවි ශනි වේවා
ඇති කරවන අපල මෙමට සහ සරණින් දුරුවේවා
තෙරුවන් ගුණ සුවඳ අමා ඔසුවෙන් මට සැපවේවා
මගේ නිවසෙ අයට මටද ජය සිරි සෙත ලං වේවා

නවග්‍රහ සහ භූත දෝස සැම දුරුවී සැප වේවා
ජය බෝරුක මුණි පිට දුන් මට ජය සිරිසෙතවේවා

ජය සිරිමා බෝරජුගේ දක්ෂිණ ශාඛා සෙවණේ
දීප ධූප මල් සුවඳින් ගිලන් පසින් පුද දෙමිනේ
දහස් දෙනා එක් රොක්වී කරන මෙපින් මෙත් සිතිනේ
දෙවියනි මියගිය මිතුරනි සැමදෙන පිං ලැබ ගන්නේ

## පිළිකුල් භාවනා කවි

තිබෙනාතුරු කරජ කා ය
සසරෙහි දුක නොවලකා ය
එය නුවණින් පස් වීකා ය
සමතා ගැලවෙන එකා ය





කලු කෙස් සුදු පැහැ කලේය
ලොම්ටික කලකදි හැලේය
ලස්සන තිය ඔප හලේය
කය පෙණ බුබුලක් වගේය

දත් මුතු ඇට මෙන් සිතේ ය
එනමුදු කලකදි වැටේ ය
මුව විහිළුවකට නැගේ ය
පට මල්ලක කටවගේ ය

තිදි යහනෙදි කට ඇරේ ය
දෙකොනින් කුණු කෙල පෙරේ ය
දුටුදන පිළිකුල් කෙරේ ය
වණයක ගඳ සිහි කෙරේ ය

දත්මුල මැලියම් බැදේ ය
ගඳ දැනු නොත් හිස රදේ ය
මුව සේදීමත් වදේ ය
දත් ලෙඩ උකටම බැදේ ය

පැහැපත් සම රැලි ගැසේ ය
ඒ මත කොරපොතු ඉසේ ය
පිය කළ අය පසු බැසේ ය
කය පරවෙන මල ලෙසේ ය

මස් පිඩු වැහැරී හැලේය
ඇට නහරත් එම පිලේය
ඇට මිදුළුත් දුක් වලේය
මේ කය මරු මුව ගිලේය

වකු ගඩුවල ලෙඩ හැදේය
විටකදි හදවත රිදේය
බොකු බඩවැල්වල වදේය
මේ කය සිර ගෙය වගේය

පෙනහලුවල දිය පිරේය
පොට වැරදුන හොත් මැරේය
ලෙඩ යහනෙදි කල කිරේය
නව දොරකින් කුණු පෙරේය

අක්මා දළඹුව වගේය
සිතුවත් කුණු වී නැසේය
කන රස දේ ගඳ ගැසේය
දුටුවත් වමනය කෙරේය

හිසමත උකුණන් ගසාය
කුස තුළ පණුවන් වසාය
පිත සෙම කිපුනොත් කසාය
සැරව පිරුණ තැන අපාය

ලේ අඩුවැඩි කමද වේය
මරුවා එහි කෙලවරේය





තිතරම දහඩිය පෙරේය
මේ කය සිහිනය වගේය

කඳුළු පිරුණු තෙල් ගලා ය
නෙත්වල කබ ඉතිරිලා ය
සොටු ගුලි කහපැහැ වෙලා ය
ලේ කැටි ගැසුනොත් මලා ය

මළ - මූ දෙක හිරිකිතේ ය
මේදය සැදුනොත් ගතේ ය
මහලු වියෙහි වක ගැසේ ය
මේ කය මිරිහුව වගේ ය

මෝහෙන් උපතත් කාමය
ඇත්තේ තිරනැති දේමය
මේකුණු කය සහ නාමය
සත්හට සතුරෙකු වේමය

මෝඩ අපට කය අගේය
මරණය දිව රැ ළහෙය
මළදා පණු කැළ නැගේය
කය වැසිකිළි වළ වගේය

අනිසයි අහෝ අනිසයි සැම දෙයම ලොවේ
මිනිසයි ගසයි පොළවයි මහ මෙරද දැවේ
මොහොතයි දෙකයි පැවැතුම ජීවිතය ලෝවේ
දුකමයි අහෝ දුකමයි සංසාර හවේ



137



# සංසාර දුකේ හැටි

සසර සරණ සතට දුබල මහලුවයස පැමිණි කලට-
-ගතද හැකිළිවතද මැලවි සෙලවෙතේ දතා
එවර දෙඇස නොපෙනි දෙකන බිහිරි ගතිය-
-සමග දෙතොල සැලුමයුතුව කටිනි හඩද ලොලො ලො ගායතා
අදර ගුණැති හිතැති මිතුරෝ නෑයෝ සැවොම-
-ඉවත බලති පණසෙ විදුව පෙමැති කතදනුරුස්සා යතා
ගෙදර ලැබුව ජාත පුතුද අපිය කරති දකින කලට -
- බලව තිබෙන දුකෙකමහත මේ ජරා පතා

මොණර පිලසෙ නිල්වන් කෙස් වැටිය සුදුව කපුකුල්ලක් -
-විලස තිබීටිකෙන්ටිකම තට්ටෙ පෑදුණා
ඉඳුනිල්මිණි දෙකක් සදිසි දෙනෙත් සුදුවකබ ගලමින් -
-ගිලුනු සෙයින් අඳුනන්නට නොහැකදුටු දනා
සරා සඳසෙ සපිරි මුහුණ රැලිවැටෙමින් හැකිල ගොසින් -
-වෙස් මුහුණක් වගේ දකින අයට යයි හිනා
කැකුලු කොදසෙ තිබුණු දසන් කෙතකට බැදි වැට -
-විලසින් තිබී පදුවවැටී ගොසින් ලොඹුව හැකුලුනා

මිහිරි හඬින් දනමනගත් මුකුලුවදන් බැරිවකිසිත් -
-කබල් බෙරය ගසනවිලස කලක් කළෙ කතා
ලොඹු දෙකොතින් කෙළ පෙරමින් ලොල්ලොල් ගාකියන -
-බසට නිවට මෝඩ කොල්ලො පෙළක් සිනා සෙති ඉතා
රහස් කියන විටත් ඇසුන දෙකන් බිහිරිවෙලා වගේ -
-හෙණ ගැසුවත් පිටිපස්සට සද්දයක් නැතා
අනේබලනු මැනවි සසරජරා මරුව දෙනහිරිහැර -
-මෙලොව සතටවේය මෙලෙස වඩනු මෙත් සිතා



රන්රුව ලෙස සුදිලෙන ගත කෙතකට බැදි පඹයෙකු ලෙස-
- දුබල වෙමින තිබෙන කලට තවත් මදි කියා
තොන්ඩුව දමමින් බෙල්ලට පොල්ලෙන් බැටදී තුනටිය -
- කඩා දමිය හැට වරුසෙදි ජරා මාරයා
ගත රුදිරය උරාබොමින් නහර බලය සූරා ගෙන -
- ලිපට දමන දරමිටියක් ලෙසින් විය කයා
එබැවින් අද අඩමින් කබ ගලමින් සිටිමා දකිමින් -
- කුසල් කරනු දරුවනි තිති සිතනු අනිස යා

නිතර මෙකුණු කයට ලොබින මසුරු කමින් දවසරිමින -
- පිනට මැලිව පවට කිසිත් බියක් නොම ගෙනා
සතිර ලෙසට මෙමරූපය සිතා නිතර වෙසෙන එ සැම -
- පළගැටිහට වෙන දේදූන හරිනු ලොබ සැනා
නිතර අනිස සිහි කරමින මුනිඳුන් දෙසූ බණ දැන ගෙන -
- එම විලසින පිළිපදිමින කුසල් කරමි නා
අජර අමර නිවන් සැපත ලැබගන්නට සිතා නිතර -
- වීරිය වඩමින් සැම දෙන පතමු විගසි නා

දුටුව අයට මන පිනවන ලෙසට රූපෙ තිබුණත් අපෙ -
- ජරා මරුව සිඳ බිඳලයි සැකක් නොම ගෙනා
තුටුව කයට සැපදීගෙන විදුවත් අප නෙක විලසින -
- දිනකදි මෙය හැරදමමින යන්ට වෙයි සැනා
කටුව පමණවත් වැඩකට ගන්ට නොහැකි මෙකුණු කයට -
- අපල වඩති මෝඩ වූ සැම නොදත් ගතියෙනා
තුටුව නිවන් සැප ලැබුමට කැටුව සැවොම එහි යැමට -
- රුවට තිබෙන ආලය හැර වඩනු භාවනා



නොතිරවූ කුණු කයක් අරගෙන තිස් දෙකක් කුණු එහි දමාගෙන
-විදිති පස්කම් සැපත නොමදන තිබෙන අනුවණ කමතිසා
විපුල වූ මහදුකක් විඳිමින් කරතිපස් පව් නිතර ලොබයෙන
-උතුම් මුණිඳුන් දෙසූ සදහම් අසා තවමත් නැති නිසා
උරුම වූ ලෙස තිබෙන නිරයක් කරන පස්පව් සැමසතුන් හට
-යන්ට යනදා ඒය මරුවා බැරුව නොගොසින් කොයි ලෙසා
පතළ වූ මුණි දෙසූ සදහම් ඇත උතුම් නිවනය ලබන්නට -
-කරවදන් පින් නොහැරවීරිය සියලු අකුසල් දුර ගසා

මෙලොව වසන සතට නියම අපල කාලෙ පැමිණි කලට -
- උරුම තිබෙන වතුදපිටිද විකිණිලා යතී
එවිට දුකිනි ඉණට වැහිලි යුතුව අතට කබල රැගෙන -
- කඳුළු පිරුණු නෙතිනි වැහැරි සිහමනේ යතී
පෙරදි බොහොම හිතැති මිතුරෝ නෑයෝ සැවොම දිවියත් ලෙස
- සතුරු වෙතිය එකද මිතුරු අයෙක් නම් නැති
කියනු කුමට පෙමැති ලියද ජාත පුතුද ඉවත බලති -
- සිතනු අපල කාලෙ සැටිය මිතුර හිත ඇති

රුවට බැබළි ගතද වියලිවතද හැකිලි නහර ඉපිලි -
- දිරිය නැතිව පඹයෙකු ලෙස වැනි වැනී යතී
පිතද සෙමද කිපී නොමද ගෙඩිද හොරිද වණ පිළියල් -
- මෙඈ නොයෙක් සෑදෙන රෝග වලින් නිම නැතී
එකල මහලු වියද පැමිණි තිබඳ ළපිරු සොවිනි කටුක -
- දුක් විඳ මහ මග දිනයක අහෝ මිය යතී
එබව සිතට රැගෙන මෙබඳු දුකක් නොවන විලස තරුණ -
- කාලෙදි හැකි පමණින් පින් කළොත් යහපතී





# ලෝවැඩ සගරාවෙන්

කලකිනි බුදු කෙනෙකුන් උපදි න්නේ
දුකකිනි මිනිසත් බව ලැබ ග න්නේ
මෙදෙකිනි මෙ සසර දුක් දුර ල න්නේ
සුදනෙනි කිම වීරිය නොකර න්නේ

කන් නන් මෙන් විස අඹ පල රි ස්සේ
මත් සත් තොස් කර කිම පල සෙ ස්සේ
දූත් දූත් එයි මරුවා පසු ප ස්සේ
ඉන් පින් මය කටයුතු නම් ද ස්සේ

ඉස ගිනි ගත්තෙකු එ ගිනි නිවන ලෙ ස
කුසලට මදකුත් පමා නුවොත් මී ස
මෙ සසර අත් හැර නො යන මෙ දුක් රු ස
වෙස සිත් නැත අත් හරිනා උපදෙ ස

කොතන උනත් නැත මරුහට බා දා
විදින මෙ සැප පින් ඇති තෙක් වේ දා
ගෙවන සසර දුක් බුදුබණ නා දා
කුමන නැටුම් කෙළි කවට සිනා දා

අද අද එයි මරු පින් කර ග න්නේ
කෙලෙසද සෙට මරු නේති සිත න්නේ
කිකලද මහසෙන් මරු ඇප ව න්නේ
කුමටද කුසලට කම්මැලි ව න්නේ



කුමටද කා බී තිති සැරසෙ ත්තේ
කොතනද මේ කය ඇරගෙන ය ත්තේ
ඇමසඳ නො මැලිව පින් කර ග ත්තේ
එමවද බව සයුරෙන් ගොඩ ල ත්තේ

හැමවිට පිනට ම සිත පා දත්තේ
තිවණට මග එම වද සා දත්තේ
වැඩකට කි බස් කිම නා දත්තේ
තිර යට වත් කල දෝ තොප දත්තේ

මස් ලේ නැති ඇට බලූ ලෙව ක ත්තේ
කුස් පිරුමක් පලයක් නොලබ ත්තේ
ලෙස ඒ සැපතෙහි ලොබ නො කර ත්තේ
දොස් නො පෙනෙන ලෙස දුක්මයි ව ත්තේ

කරන කලට පව් මීරිය මී යේ
විඳින කලට දුක් දැවී වෙයි ගිනි යේ
ඇඳින ඒ පව් දුර ලන උපදේ යේ
තුදුන මැනවි තුන් දොර අවකා යේ

අදමින් ජීවත් වෙනවා විතර ට
දැහැමින් මීය යනු සොඳමයි දනහ ට
මෙලෙසින් වදහල මුනිබණ සිහි කො ට
සැබැවින් පින්කොට පැමිණෙව් නිවන ට

ලිපගිනි මොලවන තෙක් දිය සැළියේ
සැපයක් යයි කකුළුව දිය කෙළියේ
එපමණ තොප සිතතොත් නො හැකිළියේ
සැපයක් නම් නැත කම් රස කෙළියේ



බණ නම් තිබොරුය මුනිවරය ත් තේ
කය නම් නො තිරය අදහා ගත් තේ
පණ නම් තණ අග පිණිබිඳු වැන් තේ
පින නම් නො පමාව ම කර ගත් තේ

පින් පව් නො දැන ම අනුවණ කම් කො ට
කන් නන් මස් රස සොඳ මයි කර තු ට
ඉන් ගැලවෙනු බැරි නො ගොසින් නිරය ට
දැන් එම ආලය හරිනේ අද යි ට

කාලා රසමුසු බෝජන කර පෙ ම්
ගාලා සුවඳැති සඳුනුත් මන ර ම්
ලාලා අබරණ තිසි ලෙස සැරසු ම්
පාලා ගිය වැනි බහුරූ කෝල ම්

සාරනු කුණුකයක් ඇරගෙන කරන බහුනාටක න දේ
නැර තම හිමි සමග දවසැර උන් තුමුත් සැප විඳ වි දේ
ගෝර මරුවා පැමිණි කල් දැන යන්ට කැඳවා එන ස දේ
බාර වම සිටුවන්ට බැරි වද පිනක් කර ගත්තොත් සොදේ

සරණ මුනිඳුගෙ අදහ පිනකුත් නො කර ඉන්නේ කුමටදෝ
මරණ පැමිණෙන කලට යමයා ඇවිත් කැඳවා යන්ටදෝ
කරන සොඳකම් දන්පිනක් කළ කියනු නුවණින් සොඳ වෙදෝ
කුමන අනුවණ කම් ද නැයිනි අඩනු සිටුවා ගන්ට දෝ

අඬාලා කම්පා ව උන්නත් ඉනින් දැක්මක් නො ව ත්තේ
නනාලා සිත පිනක් නො කරම කිම් ද උපයා තබත්තේ
දමාලා යන නරක කුණුකය කුමට දෝ සැප විඳි ත්තේ
දිනාලා සුරපුරට යන්නට මකී මේ බණ අස ත්තේ

දන් පින් බැරි දේකැයි නො සිත ත්තේ
අන් කල පින් අනුමෝදන් ව ත්තේ
උන් ලද පින් සරි පින් ලැබ ග ත්තේ
ඉන් වද සගමොක් සැප සාද ත්තේ

සයට වේ ද රසමුසු බත් ක ත්තේ
ගඳට වේද ඇඟ සුවඳ කර ත්තේ
ලෙඩට බේති මේ මෙ ලොව සතු ත්තේ
කුමට මීට සැපයකැයි සිත ත්තේ

මානෙන් ඉදිතත් මේ සැප පෙ රුමය
සීනෙන් ගෑ සුවඳක් මෙන් බො රුමය
දානෙන් සීලෙන් නො කලොත් ද රුමය
පානෙන් අඳුරට ගෙන යයි ක රුමය

වැණුවා නම් බුදුගුණ වැණු වාමය
තැනුවා නම් තම සිත තැනු වාමය
දෙනුවා නම් දන්පින් දෙනු වාමය
දිනුවා නම් පරලොව දිනු වාමය

පින් මිස නැයන් වන පිහිටක් නැත
උන් දෙන මතු හිමිවන දෙයකුත් නැත
ඉන් මතු අදහා සිහි කරතොත් සත
අන් කුසලක් නොකලත් මෙමම දෙයි සෙත

# රත්නමාලා බන්ධන ගාථා

සං සාර සාරෝස විනීත ණී සං
සං ණීත සාතං සුවිසාර ධී සං
සං ධීරකං සොණ්ණ තනු පලා සං
සං ලාප දෙසිං පණමෙහි සා සං

සං සාභිගං කෙවල මොහ නා සං
සං නාහකං මාර රණෙ විසෙ සං
සං සෙවිතං දාසි මුදාර හා සං
සං හාර ධම්මං පණමෙ සදා සං

සං දායගං නාසිත පාප නා සං
සං නාප ධංසිං හත සොර පා සං
සං පාර ගාමිං සුවිසාර වා සං
සං වාර සංසං පණමෙ රසා සං

සිංහල තේරුම

සසර සැඩ පහර නවතා නිවන් වැද
පැතිර නැණැති දිරි මත් රන් පතක් ලෙද
නිතර දිළෙන තුම් සදහම් දෙසන ලද
වැතිර වදිමි මගේ සම්බුදු මහිමි සද

සැක තැන් දුරු කරන එලෙසින් මෝ නසන
යුදළුම් ලෙසින් මර යුගයෙහි දිවි රකින
ඇසුරින් සතුට දෙන කෙලෙසුන් ඇති නසන
නමදිමි බැතින් සිරි සදහම් මිණි පහන

සග සැප දෙන නැසිය යුතු පව් තැම නසන
බව බැමි සුනු විසුනු කර නිති ගුණ පුරන
ලත් සැප දමා පර තෙර වෙත නෙත යොමන
වදිනෙමි නිතිපතා පින්සරු මහ සහන

මේ ගාථා තුන දිනපතා උදේ සවස භාවිතා කිරීමෙන් නවග්‍රහ අපලවලින් ඇතිවන මාරක රෝගයන්ද, අමුනුෂ්‍යාදි උපද්‍රවයන්ද නැතිවී තම අභිමතාර්ථ සඵලවී දියුණුව සැලසෙන බවත් සියලු උවදුරු වලින් මිදී නිදුක්ව නිරෝගීව මෙලොව ජීවිතය වාසනාවෙන් හා සෞභාග්‍යයෙන් පිරී ඉතිරී යන බවත් විශ්වාස කරනු ලැබේ. තවද මිත්‍ර ලාභය, උසස් අයගේ ඇසුර, පවුල්වල අසමගිකම් නැතිකර ගැනීමටද පූද සත්කාර නොමැති ස්ථාන වලින් සර්වඥ ධාතු සීවලී ධාතු ගෙන්වා ගැනීමේ ශක්තිය ද ඇත්තේය.

"Wherever the Buddha's teachings have flourished,
either in cities or countrysides,
people would gain inconceivable benefits.
The land and people would be enveloped in peace.
The sun and moon will shine clear and bright.
Wind and rain would appear accordingly,
and there will be no disasters.
Nations would be prosperous
and there would be no use for soldiers or weapons.
People would abide by morality and accord with laws.
They would be courteous and humble,
and everyone would be content without injustices.
There would be no thefts or violence.
The strong would not dominate the weak
and everyone would get their fair share."

**※ THE BUDDHA SPEAKS OF
THE INFINITE LIFE SUTRA OF
ADORNMENT, PURITY, EQUALITY
AND ENLIGHTENMENT OF**
*THE MAHAYANA SCHOOL* ※

## Taking Refuge with a mind of Bodhichitta

**In the Buddha, the Dharma and the Sangha,**
**I shall always take refuge**
**Until the attainment of full awakening.**

**Through the merit of practicing generosity**
**and other perfections,**
**May I swiftly accomplish Buddhahood,**
**And benefit of all sentient beings.**

## The Prayers of the Bodhisattvas

**With a wish to awaken all beings,**
**I shall always go for refuge**
**To the Buddha, Dharma, and Sangha,**
**Until I attain full enlightenment.**

**Possessing compassion and wisdom,**
**Today, in the Buddha's presence,**
**I sincerely generate**
**the supreme mind of Bodhichitta**
**For the benefit of all sentient beings.**

**"As long as space endures,**
**As long as sentient beings dwell,**
**Until then, may I too remain**
**To dispel the miseries of all sentient beings."**

# *GREAT VOW*

***BODHISATTVA EARTH-TREASURY***
***( BODHISATTVA KSITIGARBHA )***

***" Unless Hells become empty,***
***I vow not to attain Buddhahood;***
***Till all have achieved the Ultimate Liberation,***
***I shall then consider my Enlightenment full !"***

***Bodhisattva Earth-Treasury is***
***entrusted as the Caretaker of the World until***
***Buddha Maitreya reincarnates on Earth***
***in 5.7 billion years.***

***Reciting the Holy Name:***
***NAMO BODHISATTVA EARTH-TREASURY***

***Karma-erasing Mantra:***
***OM BA LA MO LING TO NING SVAHA***

With bad advisors forever left behind,
From paths of evil he departs for eternity,
Soon to see the Buddha of Limitless Light
And perfect Samantabhadra's Supreme Vows.

The supreme and endless blessings
of Samantabhadra's deeds,
I now universally transfer.
May every living being, drowning and adrift,
Soon return to the Pure Land of
Limitless Light!

~The Vows of Samantabhadra~

I vow that when my life approaches its end,
All obstructions will be swept away;
I will see Amitabha Buddha,
And be born in His Western Pure Land of
Ultimate Bliss and Peace.

When reborn in the Western Pure Land,
I will perfect and completely fulfill
Without exception these Great Vows,
To delight and benefit all beings.

~The Vows of Samantabhadra
Avatamsaka Sutra~

# DEDICATION OF MERIT

May the merit and virtue
accrued from this work
adorn Amitabha Buddha's Pure Land,
repay the four great kindnesses above,
and relieve the suffering of
those on the three paths below.
May those who see or hear of these efforts
generate Bodhi-mind,
spend their lives devoted to the Buddha Dharma,
and finally be reborn together in
the Land of Ultimate Bliss.
Homage to Amita Buddha!

NAMO AMITABHA
南無阿彌陀佛

【斯里蘭卡巴利文：課誦本】
財團法人佛陀教育基金會　印贈
台北市杭州南路一段五十五號十一樓
Printed and donated for free distribution by
**The Corporate Body of the Buddha Educational Foundation**
11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.
Tel: 886-2-23951198 , Fax: 886-2-23913415
Email: overseas@budaedu.org
Website:http://www.budaedu.org
**This book is strictly for free distribution, it is not to be sold.**
නොමිලයේ බෙදාදීම පිණිසයි.
Printed in Taiwan
4,000 copies; July 2015
SR029-13380